

# මානව හිමිකම් වෙනුවෙන්

# උද්දේශනය

Right to Life Human Rights Center

# මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනය
# Advocacy for Human Rights

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනය

පළමු සංස්කරණය:

2024 සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී

ප්‍රකාශනය:
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය
56/2, පාලිත පෙදෙස
කොළඹ 9
www.righttolife.lk

© 2024 [Right to Life Human Rights Center]

කර්තෘ/ සංස්කාරක: අජිත් පැරකුම් ජයසිංහ

කවර නිර්මාණය: අනුදි නිසල්‍යා වීරසිංහ

පිටු සැලසුම සහ මුද්‍රණය:
ඩිසයින් සිස්ටම්ස් (පුද්) සමාගම
23/1, 1 වන මාළිගාකන්ද පටුමග, කොළඹ 10

ISBN: 978-624-5860-10-4

ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරනු ලබන මානව හිමිකම් ආරක්ෂකයන්ගේ උද්දේශන හැකියා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සම්පාදනය කරන ලදි.

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශිත අදහස් කර්තෘගේ අදහස් වන අතර, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ හෝ එහි අනුබද්ධ ආයතනවල නිල ප්‍රතිපත්තිය හෝ ස්ථාවරය එමගින් අවශ්‍යයෙන්ම පිළිබිඹු නොවේ.

අවසර හෝ විමසීම් සඳහා, කරුණාකර සම්බන්ධ වන්න:
mail@righttolife.lk

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| ■ | පෙරවදන | 5 |
| 1 | මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) හැඳින්වීම | 7 |
| | අරමුණ | 7 |
| | මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) අර්ථ දැක්වීම සහ ප්‍රධාන ලක්ෂණ | 7 |
| | මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ගෝලීය සහ දේශීය කාර්යභාරය | 7 |
| | මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා නීතිමය රාමු සහ ආරක්ෂණ | 8 |
| | ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් මුහුණ දෙන අභියෝග | 9 |
| 2 | මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා උද්දේශනයේ වැදගත්කම | 11 |
| | අරමුණ | 7 |
| | උද්දේශනය පිළිබඳ නිර්වචන සහ මානව හිමිකම් සුරැකීමේදී එහි කාර්යභාරය | 11 |
| | ක්‍රියාකාරිකභාවයෙන් උද්දේශනය වෙන්කර හඳුනා ගැනීම: උද්දේශනය නිර්මාණාත්මක, සබඳතා මත පදනම් වූ ප්‍රවේශයක් ලෙස | 12 |
| | මානව හිමිකම් නීතියේ සන්දර්භය තුළ උද්දේශනය: රාජ්‍ය ප්‍රතිපත්ති, නීති සම්පාදනය සහ සමාජ වෙනස කෙරෙහි බලපෑම | 13 |
| | උද්දේශනය හා ප්‍රවර්ධනය | 14 |
| 3 | ඵලදායී උද්දේශන සැලැස්මක් සංවර්ධනය කිරීම | 16 |
| | අරමුණ | 7 |
| | උද්දේශන සැලසුම් චක්‍රය හැඳින්වීම | 16 |
| | 1. ගැටලු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම | 17 |
| | 2. ඉලක්ක (goals) සහ අරමුණු (objectives) සැකසීම | 18 |
| | 3. පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම (බලය/බලපෑම සහ උනන්දුව) | 19 |

| | | |
|---|---|---|
| | 4. උපායමාර්ග (strategies) සංවර්ධනය කිරීම, උපක්‍රම (tactics) තෝරා ගැනීම සහ පණිවිඩ යැවීම | 20 |
| | පොදු උද්දේශන උපක්‍රමඃ | 20 |
| 4 | උද්දේශන උපක්‍රම සහ මෙවලම් | 22 |
| | අරමුණ | 7 |
| | සාකච්ඡා මගින් බලපෑම් | 22 |
| | ප්‍රායෝගික දැනුම | 26 |
| 5 | උද්දේශනයේ අවදානම් කළමනාකරණය | 31 |
| | අරමුණ | 7 |
| | දේශපාලන, නීතිමය සහ ආරක්ෂක අවදානම් අවම කිරීම | 32 |
| 6 | උද්දේශනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව | 34 |
| | අරමුණ | 7 |
| | සිද්ධි අධ්‍යයන සහ උදාහරණ | 36 |
| 7 | දේශගුණික විපර්යාස සහ මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනය | 38 |
| | අරමුණ | 7 |
| | මානව හිමිකම් මත දේශගුණික විපර්යාස බලපෑම | 38 |
| | පාරිසරික යුක්තිය වෙනුවෙන් උද්දේශනය මානව අයිතිවාසිකමක් ලෙස | 40 |
| ■ | සමාප්ති සටහන | 43 |

# ■ පෙරවදන

මානව හිමිකම් ආරක්ෂකයෝ (HRD) ලොව පුරා යුක්තිය, සමානාත්මතාව සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරති. ශ්‍රී ලංකාවේ ද මානව හිමිකම් ආරක්ෂකයෝ නිරතුරුව අවදානමට ලක්වෙති.නීතිමය සීමාවන්ගේ සිට භෞතික තර්ජන ඒ අතර වේ. එහෙත්, කොන් කරන ලද ජනයා වෙනුවෙන් පෙනී සිටීම සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු ආයතන වගවිය යුතු තත්වයට පත්කිරීමේදී ඔවුන්ගේ කාර්යය ඉතා වැදගත් වේ. විශේෂයෙන්ම 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත වැනි නීති මතුවීමත් සමඟ, වඩාත් සංකීර්ණ සහ සීමාකාරී පරිසරයක් තුළ, ඔවුහු උද්දේශන කටයුතු කාර්යක්ෂමව සහ ආරක්ෂිතව කරගෙන යා යුතුය. එබැවින් අවශ්‍ය කුසලතා, මෙවලම් සහ උපායමාර්ගවලින් මානව හිමිකම් ආරක්ෂකයන් සන්නද්ධ කිරීම වෙන කවරදාටත් වඩා වැදගත් වී ඇත.

මෙම පොත සම්පාදනය කර ඇත්තේ මානව හිමිකම් ආරක්ෂකයන්ගේ උද්දේශන හැකියාව ඉහළ නැංවීම සඳහා සහ ඔවුන්ගේ බලපෑම උපරිම කරමින් ඔවුන් මුහුණ දෙන අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමට උපකාර කිරීම වෙනුවෙනි. එහි පරිච්ඡේද මගින් මානව හිමිකම් ආරක්ෂකයන්ගේ කාර්යභාරය සහ ඔවුන් මුහුණ දෙන ගෝලීය සහ දේශීය අභියෝග පිළිබඳ අවබෝධයේ සිට, උපාය මාර්ගික උද්දේශන සැලසුම් සංවර්ධනය කිරීම, ප්‍රධාන පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම සහ සතුරු පරිසරයන්හි අවදානම් අවම කරගැනීම දක්වා, සාර්ථක උද්දේශනය සඳහා අවශ්‍ය තීරණාත්මක පාඩම් සාකච්ඡා කරයි. සෑම පරිච්ඡේදයක්ම සකස් කර ඇත්තේ ප්‍රායෝගික විසඳුම් සහ සැබෑ ලෝකයේ අත්දැකීම් සාකච්ඡා කිරීම සඳහා වන අතර, දුෂ්කර තත්වයන් යටතේ පවා මානව හිමිකම් ආරක්ෂකයන් හට විශ්වාසයෙන් යුතුව තම කාර්යය කරගෙන යාමට හැකි බව එමගින් සහතික කරයි.

මානව හිමිකම් කටයුතුවලදී උද්දේශනයේ වැදගත්කම අති විශාලය. උද්දේශන කාර්යභාරය විසින් ආයතන වගවීම පමණක් නොව අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ද මෙහෙයවයි. බොහෝ විට මානව හිමිකම් සඳහා වන අවසාන ආරක්ෂකයන් වන මානව හිමිකම් ආරක්ෂකයන් හට ඵලදායී උපායමාර්ග සැකසීමට, තීරණ ගන්නන් සමඟ සම්බන්ධ වීමට සහ ඔවුන්ගේ කාර්යයේ ආවේනික අවදානම් කළමනාකරණයට සහාය අවශ්‍ය වේ.

මෙම පොත පාදක කරගත් පුහුණුව අවසන් වන විට, මානව හිමිකම් වෙනුවෙන් වඩාත් ඵලදායී ලෙස පෙනී සිටීමට (උද්දේශනයට) අවශ්‍ය දැනුම සහ මෙවලම්වලින් මානව හිමිකම් ආරක්ෂකයන් සන්නද්ධ වනු ඇත. එමගින් ඔවුන්ගේ හඬට සවන් දෙන බව සහතික කරනු ලබන අතර අවදානම් හමුවේ පවා යුක්තිය සහ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීමට ඔවුන්ට ඇති හැකියාව වර්ධනය වේ. මෙය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා වටිනා මූලාශ්‍රයක් ලෙස ක්‍රියා කරනු ඇතැයි ද, ඔවුන්ගේ ධෛර්ය සම්පන්න සහ අත්‍යවශ්‍ය වැඩකටයුතු කරගෙන යාමට ඔවුන්ව බලගන්වනු ඇතැයි ද අපි බලාපොරොත්තු වෙමු.

# 1 මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) හැඳින්වීම

**අරමුණ:**

**ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්ෂේත්‍රයේ මානව හිමිකම් ආරක්ෂකයන්ගේ කාර්යභාරය සහ වැදගත්කම අවබෝධ කර ගැනීම.**

## මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) අර්ථ දැක්වීම සහ ප්‍රධාන ලක්ෂණ

මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) යනු මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා කැප වූ පුද්ගලයන්, කණ්ඩායම් හෝ සංවිධාන වේ. ඔවුහු විවිධ අංශවල ක්‍රියාත්මක වෙති. ප්‍රකාශනයේ නිදහස, සාධාරණ නඩු විභාග, ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතාවය සහ ආන්තික හෝ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් වැනි කාරණා වෙනුවෙන් ඔවුහු පෙනී සිටිති. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් රජයන්, ආයතන සහ සමාගම් වගවන තත්වයට පත්කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයෝ සාමකාමී, ප්‍රචණ්ඩකාරී නොවන ක්‍රම භාවිතා කරන අතර, බොහෝ විට එසේ කිරීමේදී ඔවුන්ගේ ආරක්ෂාව අවදානමට ලක් වේ.

මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ප්‍රධාන ලක්ෂණ අතර සාමකාමී උද්දේශනය සඳහා ඔවුන්ගේ කැපවීම, විශ්වීය මානව හිමිකම් කෙරෙහි ඔවුන්ගේ අවධානය සහ ඔවුන් මුහුණ දෙන හිරිහැර, ප්‍රචණ්ඩත්වය සහ නීතිමය අභියෝග වැනි අවදානම් ද ඇතුළත් වේ. මෙම අභියෝග මධ්‍යයේ වුවද, ගෝලීය වශයෙන් සහ ප්‍රාදේශීය සන්දර්භයන් තුළ මානව හිමිකම් ඉදිරියට ගෙන යාමේදී ඔවුහු තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරති. බොහෝ විට හඬක් නැති අයගේ හඬ ලෙස ක්‍රියා කරති.

## මානව හිමිකම් ආරක්ෂකයන්ගේ ගෝලීය සහ දේශීය කාර්යභාරය

ගෝලීය වශයෙන්, මානව හිමිකම් ආරක්ෂකයන් විවිධ පරිසරයන් තුළ ක්‍රියාත්මක වන අතර බොහෝ විට, දේශපාලන මර්දනය, සන්නද්ධ ගැටුම් හෝ සැලකිය යුතු නීතිමය අභියෝග සහිත කලාපවල අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිති. ඔවුන්ගේ කාර්යය නීතිමය උද්දේශන සහ මහජන දැනුවත් කිරීමේ

ව්‍යාපාරවල සිට මානව හිමිකම් කඩවීම්වලට ගොදුරු වූවන්ට සෘජු සහයෝගය ලබා දීම දක්වා විහිදේ.

නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය (R2L) යුක්තිය සහ වගවීම වෙනුවෙන් උද්දේශනයේදී මානව හිමිකම් ආරක්ෂකයන්ගේ වැදගත් කාර්යභාරය සඳහා නිදසුනකි. 2003 දී පිහිටුවන ලද, R2L සංවිධානය බලහත්කාර අතුරුදහන් කිරීම්, නීති විරෝධී ඝාතන සහ වධහිංසනය ඇතුළු රාජ්‍යය විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට එරෙහිව සටන් කිරීම සඳහා අවධානය යොමු කර ඇත. R2L විසින් වින්දිතයින්ට අතිශය වැදගත් නීති ආධාර සපයනු ලැබේ. ඒ වෙනුවෙන් මහජන උද්දේශනයෙහි නිරත වේ. රට පුරා විහිදි මානව හිමිකම් ප්‍රථමාධාර මධ්‍යස්ථාන (HRFACs) ජාලය හරහා මානව හිමිකම් කඩකිරීම් පිළිබඳ දැනුවත් කිරීම ද සිදු කරයි.

R2L ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ඉස්මතු කරමින් බහුවිධ මාධ්‍ය වේදිකා හරහා මානව හිමිකම් ආරක්ෂකයන්ගේ හඬ විස්තාරණය කරයි. මෙම දේශීය කාර්යභාරය මානව හිමිකම් ආරක්ෂා කිරීමට සහ අයිතිවාසිකම් කඩවීම්වලට ගොදුරු වූවන්ට යුක්තිය පසිඳලීම සඳහා වේදිකාවක් සැපයීමේ පුළුල් ගෝලීය ප්‍රයත්නයක කොටසකි.

## මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා නීතිමය රාමු සහ ආරක්ෂණ

ජාත්‍යන්තර වශයෙන්, මානව හිමිකම් ආරක්ෂකයින් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය (1998)[1] වැනි රාමු යටතේ මානව හිමිකම් ආරක්ෂකයන්ට ආරක්ෂාව ලබාදී ඇත. මෙම ප්‍රකාශය මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට, ආරක්ෂාව ලබා ගැනීමට සහ බිය ගැන්වීම්වලට හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ නොදී නිදහසේ ක්‍රියා කිරීමට මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා ඇති අයිතිවාසිකම් ඉදිරිපත් කරයි. මානව හිමිකම් ආරක්ෂකයන්ගේ තත්ත්වය පිළිබඳ විශේෂ වාර්තාකරු හරහා එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය ද සිදු වේ. එය ගෝලීය වශයෙන් මානව හිමිකම් ආරක්ෂකයන්ට මුහුණ දීමට සිදු වන තර්ජන සම්බන්ධයෙන් කටයුතු කිරීමට උපකාරී වේ.

ශ්‍රී ලංකාව තුළ, මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා නීතිමය රැකවරණය සීමිතය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් භාෂණයේ, ප්‍රකාශනයේ සහ සංවිධානය වීමේ නිදහස ඇතුළු මූලික අයිතිවාසිකම් සහතික කරන මුත්, මෙම අයිතීන් ප්‍රායෝගිකව සැම විටම තහවුරු වන්නේ නැත. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත හඳුන්වාදීම, විශේෂයෙන්ම ඩිජිටල් උද්දේශනය සහ ප්‍රකාශනයේ

1 https://www.ohchr.org/en/special-procedures/sr-human-rights-defenders/declaration-human-rights-defenders#:~:text=The%20Declaration%20on%20human%20rights,Declaration%20on%20human%20rights%20defenders

නිදහස සම්බන්ධයෙන් තවදුරටත් සීමා කිරීම් සිදු කරයි. මෙම නීතිය විශේෂයෙන් මාර්ගගත සන්නිවේදනය ඉලක්ක කරයි, මානව හිමිකම් ආරක්ෂකයන්ට ඩිජිටල් අවකාශයන්හි නිදහසේ කටයුතු කිරීමට බාධා කරයි.

තර්ජන හෝ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන්ට නීතිමය පිළිසරණ අවමය. එමඟින් ඔවුන්ගේ කාර්යය කාර්යක්ෂමව කරගෙන යාමට ඇති හැකියාව දුර්වල කරයි. ජාත්‍යන්තර රාමු යම් මට්ටමක ආරක්ෂාවක් ලබා දුන්නද, ශක්තිමත් දේශීය යාන්ත්‍රණයන් නොමැතිකම මානව හිමිකම් ආරක්ෂකයන් අවදානම් තත්ත්වයකට පත් කරයි.

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් මුහුණ දෙන අභියෝග

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් අභියෝග රාශියකට මුහුණ දෙන අතර එමගින් ඔවුන්ගේ හැකියාවන්ට බාධා සිදු වේ. මෙම අභියෝගවලට පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ:

**1. නීතිමය බාධක:**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සහ අනෙකුත් සීමාකාරී නීති මගින් මානව හිමිකම් වෙනුවෙන් නිදහසේ අදහස් ප්‍රකාශ කිරීම සහ මහජන සහයෝගය බලමුළුගැන්වීම සීමා කරයි. එම පනත මගින් ඇතැම් ප්‍රකාශ අසත්‍ය ප්‍රකාශ බව තීරණය කිරීමේ බලය රජයට ලැබේ. මෙම නීති බොහෝ විට භාවිතා කරනුයේ විසම්මුතික අදහස් නිහඬ කිරීම සඳහා වන අතර, නීතිමය ප්‍රතිවිපාකවලට බිය වන මානව හිමිකම් ආරක්ෂකයෝ මේ හේතුවෙන් ස්වයං වාරණ පනවා ගනිති.

**2. ආරක්ෂක අවදානම්:**

මානව හිමිකම් ආරක්ෂකයෝ රාජ්‍ය සහ වෙනත් අංශවලින් නිරතුරුවම හිරිහැර කිරීම්, බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ තර්ජනවලට මුහුණ දෙති. ශාරීරික තර්ජන සහ ආවේක්ෂණය හෙවත් ඔත්තුකරුවන් යොදා නිරීක්ෂණය කිරීම සුලබ තත්වයන්ය. විශේෂයෙන්ම දූෂණය, නීති විරෝධී ඝාතන, හෝ පොලිස් අපචාර වැනි දේශපාලනික වශයෙන් සංවේදී කාරණා සම්බන්ධයෙන් වැඩ කරන අයට මෙම තත්වයන්ට වැඩිපුර මුහුණ දීමට සිදු වේ.

**3. දේශපාලන මැදිහත්වීම්:**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලධාරීහු බොහෝ විට මානව හිමිකම් ආරක්ෂකයන් විරුද්ධවාදීන් ලෙස සලකන අතර, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මර්දනය කිරීමට

උත්සාහ කරති. රාජ්‍යය විසින් සිදු කරන ලද මානව හිමිකම් කඩකිරීම්වලට එරෙහිව පෙනී සිටින මානව හිමිකම් ආරක්ෂකයන් බොහෝවිට නීතිමය ක්‍රියාමාර්ග හෝ මහජන අපකීර්තියට පත් කිරීම ඇතුළු දේශපාලන මැදිහත්වීම්වලට මුහුණ දෙති. දේශපාලන තර්ජන හේතුවෙන් මානව හිමිකම් ආරක්ෂකයන්ට උද්දේශන කටයුතු දුෂ්කර වේ.

**4. සම්පත් සහ සහාය නොමැතිකම:**

බොහෝ මානව හිමිකම් ආරක්ෂකයන් සේවය කරන්නේ සීමිත සම්පත් සහ අඩු ආයතනික සහයෝගයක් සහිතවයි. එබැවින් දිගුකාලීන උද්දේශන ප්‍රයත්නයන් පවත්වා ගැනීම අපහසු වේ. පුහුණුව, නීතිමය සහාය සහ බිම් මට්ටමේ බලමුළු ගැන්වීම හරහා මානව හිමිකම් ආරක්ෂකයන්ට සහාය වීමට R2L දරන උත්සාහය මෙම පරතරය පියවාලීම සඳහා තීරණාත්මක වේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන්ගේ අරගල සහ සාර්ථකත්වයන් සම්බන්ධ සැබෑ ජීවිත අත්දැකීම් විශ්ලේෂණය කිරීමෙන් මානව හිමිකම් ආරක්ෂකයන් මුහුණ දෙන සැබෑ අභියෝග තේරුම් ගැනීමට සහ මෙම බාධක ජය ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුම් ගවේෂණය කිරීමට උපකාරී වනු ඇත.

උදාහරණයක්: ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ මානව හිමිකම් ආරක්ෂකයෙකු වන රුකී ප්‍රනාන්දු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) යටතේ 2014 මාර්තු මාසයේදී අත්අඩංගුවට ගනු ලැබීය. උතුරු පළාතේ අත්අඩංගුවට ගත් කාන්තාවකට සහ ගැහැණු ළමයෙකුට සහය දැක්වීමට උත්සාහ කිරීමේදී ඔහු ක්‍රිස්තියානි පූජකවරයෙකු සමඟ අත්අඩංගුවට ගන්නා ලදි. ත්‍රස්තවාදයට සහාය දෙන බවට රජය ඔහුට චෝදනා කළ නමුත් බොහෝ දෙනා මෙම චෝදනා අසත්‍ය බවත්, අත්අඩංගුවට ගැනීම මගින් ඔහුව නිහඬ කිරීමට අදහස් කළ බවත් විශ්වාස කළහ. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානවල දැඩි විවේචන හේතුවෙන් ඔහු නිදහස් කරන ලදි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් ඉලක්ක කර ගැනීම සඳහා බොහෝ විට අවභාවිත වන ආකාරය මෙම සිදුවීමෙන් පැහැදිලි වේ.

# 2 මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා උද්දේශනයේ වැදගත්කම

**අරමුණ:**

**උද්දේශනයේ මූලික මූලධර්ම හඳුනාගැනීම සහ එය මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) සඳහා තීරණාත්මක වන්නේ මන්දැයි තේරුම් ගන්න.**

## උද්දේශනය පිළිබඳ නිර්වචන සහ මානව හිමිකම් සුරැකීමේදී එහි කාර්යභාරය

උද්දේශනය යනු තීරණ ගන්නන්ට බලපෑම් කිරීම සහ එමගින් ධනාත්මක සමාජ වෙනස්කම් ඇති කිරීමේ අරමුණ සහිතව, යම් අරමුණක්, ප්‍රතිපත්තියක් හෝ අදහසක් වෙනුවෙන් ක්‍රියාකාරීව සහාය දැක්වීම, ප්‍රවර්ධනය කිරීම හෝ එයට පක්ෂව තර්ක කිරීමේ ක්‍රියාවලියයි. මානව හිමිකම් සන්දර්භය තුළ, ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උද්දේශනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. අයුක්තියට අභියෝග කිරීමට, අවදානමට ලක්විය හැකි ජනගහනයන් ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කිරීමට සහ ආණ්ඩු සහ ආයතන වගවීමට ලක්කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයෝ උද්දේශනය භාවිතා කරති.

පර්යේෂණ, සන්ධාන ගොඩ නැගීම, උපාය මාර්ගික පණිවිඩ සන්නිවේදනය සහ ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සෘජුව සම්බන්ධ වීම ඇතුළු ක්‍රියාකාරකම් රාශියක් උද්දේශන ක්‍රියාවලියට ඇතුළත් වේ. මානව හිමිකම් ආරක්ෂකයන් සහ උද්දේශන සංවිධාන මහජනතාව දැනුවත් කිරීම, ප්‍රතිපත්ති කෙරෙහි බලපෑම් කිරීම සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට විසඳුම් ලබා දීම මගින් උද්දේශනයෙහි නිරත වේ. උද්දේශනය හරහා, මානව හිමිකම් උල්ලංඝනය කිරීම් කෙරෙහි අවධානය යොමු කිරීමට සහ යුක්තිය, සමානාත්මතාවය සහ සැමට ආරක්ෂාව ප්‍රවර්ධනය කරන පද්ධතිමය වෙනස්කම් සඳහා බලපෑම් කිරීමට මානව හිමිකම් ආරක්ෂකයන් සමත් වේ.

## ක්‍රියාකාරිකභාවයෙන් උද්දේශනය වෙන්කර හඳුනා ගැනීම: උද්දේශනය නිර්මාණාත්මක, සබඳතා මත පදනම් වූ ප්‍රවේශයක් ලෙස

උද්දේශනය සහ ක්‍රියාකාරිකභාවය සමීපව සම්බන්ධ වන අතර බොහෝ විට සමාන වේ. එහෙත්, භාවිතා කරන ක්‍රම සහ අරමුණු අනුව ඒවා සැලකිය යුතු ලෙස වෙනස් වේ. උද්දේශනය සාමාන්‍යයෙන් සුබවාදී වන අතර සම්බන්ධතා මත පදනම් වේ. ස්ථාපිත පද්ධති සහ ආයතන තුළ වෙනසක් සාක්ෂාත් කර ගැනීම සඳහා තීරණ ගන්නන් සමඟ සංවාදය සහ සහයෝගීතාවය කෙරෙහි උද්දේශනයෙහිදී අවධානය යොමු කරයි. මහජන ප්‍රතිපත්ති හෝ නීතිවලට බලපෑම් කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සමග සාකච්ඡා කරමින් සාකච්ඡා මගින් බලපෑම් කිරීම, ප්‍රතිපත්තිමය කාරණා සමග සම්බන්ධ වීම සහ හවුල්කාරිත්වය වැනි විරුද්ධවාදී නොවන ප්‍රවේශයන් උද්දේශනයට ඇතුළත් වේ. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන්, විධිමත් සන්නිවේදනය සහ නිර්මාණාත්මක මැදිහත්වීම් හරහා විසඳුම් සහ ප්‍රතිසංස්කරණ යෝජනා කිරීම මගින් "පවත්නා ක්‍රමය තුළ" වැඩ කිරීම උද්දේශනයේ ස්වභාවයයි.

ඊට ප්‍රතිවිරුද්ධව, ක්‍රියාකාරිකභාවයට බොහෝ විට ඇතුළත් වන්නේ මහජනතාව දැනුවත් කිරීම හෝ නිශ්චිත සමාජ හෝ දේශපාලන ගැටලු විසඳීම සඳහා බලධාරීන්ට බලපෑම් කිරීම අරමුණු කරගත් වඩාත් ඍජු හා ගැටුම්කාරී ක්‍රියා ය. කිසියම් අරමුණක් කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා ක්‍රියාකාරිකයන් විසින් විරෝධතා, සිවිල් නීති කඩකිරීම් හෝ වෙනත් අවිහිංසාවාදී ක්‍රියා සංවිධානය කළ හැකිය. මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා උද්දේශනය සහ ක්‍රියාකාරිකභාවය යන දෙකම තීරණාත්මක වේ. උද්දේශනය දිගුකාලීන සබඳතා ගොඩනැගීමට සහ විධිමත් පද්ධති තුළ වැඩ කිරීමට ප්‍රමුඛත්වය දෙයි. ක්‍රියාකාරිකභාවය බිම් මට්ටමේ බලමුළුගැන්වීම සහ මහජන උද්ඝෝෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

උදාහරණ: 2022 වසරේ ආර්ථික අර්බුදය දරුණු තත්වයට පත්වීමත් සමග ශ්‍රී ලංකාවේ බොහෝ තැන්වල පැනනැගුණු උද්ඝෝෂණ අයත් වන්නේ ක්‍රියාකාරිකභාවයටයි. ඒවා පැවති පාලනය ප්‍රතික්ෂේප කර නව පාලනයක් පත්කරගැනීම සඳහා ඍජු, ගැටුම්කාරී උද්ඝෝෂණ විය. එහෙත්, ඒ අතරම, සාධනීය වෙනස්කම් කිරීම සඳහා ශ්‍රී ලංකා නීතීඥ සංගමය, සාධාරණ සමාජයක් සඳහා ජාතික ව්‍යාපාරය වැනි සංවිධාන උද්දේශනයේ යෙදුණහ. ඔවුන් එසේ කළේ අදහස් විමසීම්, විධිමත් අන්දමින් විසඳුම් කෙටුම්පත් කිරීම් හා ඒවා පිළිබඳ සාකච්ඡා, සංවාද ආදිය හරහාය.

## මානව හිමිකම් නීතියේ සන්දර්භය තුළ උද්දේශනය: රාජ්‍ය ප්‍රතිපත්ති, නීති සම්පාදනය සහ සමාජ වෙනස කෙරෙහි බලපෑම

මානව හිමිකම් නීතියේ විෂය පථය තුළ උද්දේශනය යනු රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීම, නීති ප්‍රතිසංස්කරණය කිරීම සහ සමාජ වෙනසට බලපෑම් කිරීම සඳහා යොදාගත හැකි ප්‍රබල මෙවලමකි. මානව හිමිකම් ප්‍රගතිය සහ ආරක්ෂාව සඳහා බලපෑම් කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයන් සහ උද්දේශන සංවිධාන බොහෝ විට නීතිමය රාමු භාවිතා කරති. ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් අපරානුමත කිරීම, අසාධාරණ නීති අවලංගු කිරීම හෝ ආන්තික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන නව නීති සම්පාදනය කිරීම මෙයට ඇතුළත් විය හැකිය.

නිදසුනක් වශයෙන්, ශ්‍රී ලංකාවේ, උද්දේශන ප්‍රයත්නයන් සැලකිය යුතු මට්ටමකින් නීතිමය ප්‍රතිසංස්කරණවලට සාර්ථක ලෙස දායක වී ඇත. රාජ්‍ය ආයතනවල වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් සහතික කරන තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) පිළිබඳ පනත සම්මත කිරීම උද්දේශන ව්‍යාපාරවල ජයග්‍රහණයකි. මීට පෙර මාධ්‍යවේදීන් නිශ්ශබ්ද කිරීමට සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කිරීමට යොදාගත් සාපරාධී අපහාස නීතිය 2002දී අවලංගු කිරීමට ද උද්දේශන ව්‍යාපාර ඉවහල් විය.

ප්‍රතිපත්ති සම්පාදකයින්, නීති විශාරදයින් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සම්බන්ධ වී රජයන්ගේ සහ ආයතනවල ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීමට ඵලදායී උද්දේශන ව්‍යාපාරවලට හැකියාව ඇත. එවැනි උත්සාහයන් මගින් මානව හිමිකම් ප්‍රමිතීන් නෛතික රාමු තුළට ඒකාබද්ධ කිරීමටත්, නීතියේ ආධිපත්‍යය උල්ලංඝනය කිරීම්වලින් පුද්ගලයන් ආරක්ෂා කිරීමටත් හැකි වේ. උද්දේශනයේ බලපෑම නීතිමය ප්‍රතිසංස්කරණවලින් ඔබ්බට විහිදෙමින් මහජන ආකල්ප සහ සම්මතයන් කෙරෙහි බලපායි. තිරසාර ප්‍රචාරණ ව්‍යාපාර හරහා, මානව හිමිකම් සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම, ප්‍රජාවන් දැනුවත් කිරීම සහ යුක්තිය සහ මානව හිමිකම් ආරක්ෂා කරන ලෙස ඉල්ලා සිටීම සඳහා පුද්ගලයන් බලමුළු ගැන්වීමට හැකිය. මෙම ක්‍රියාවලිය ඔස්සේ මානව හිමිකම්වලට ගරු කිරීමේ සංස්කෘතියක් පෝෂණය කරන අතර කල් පවත්නා සමාජ වෙනසක් සඳහා එය දායක වේ.

## ක්‍රියාකාරකම්: ශ්‍රී ලංකාවේ සාර්ථක උද්දේශන ව්‍යාපාර පිළිබඳ සාකච්ඡා කරන්න.

ශ්‍රී ලංකාවේ සාර්ථක උද්දේශන ව්‍යාපාර පිළිබඳ සැබෑ ලෝක උදාහරණ කෙරෙහි අවධානය යොමු කරන්න. සිද්ධි අධ්‍යයනවලට පහත දැක්වෙන උදාහරණ ඇතුළත් විය හැකිය:

- තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) සඳහා උද්දේශන ව්‍යාපාරය: 2016දී RTI පනත සම්මත කිරීමට හේතු වූයේ දශකයක දීර්ඝ උද්දේශන ප්‍රයත්නයකි. මෙම පනත රජයේ විනිවිදභාවය වැඩි කළ අතර පොදු තොරතුරු වෙත පුරවැසියන්ගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට සහ වැඩි වගවීමකට දායක විය.

- ප්‍රකාශනයේ නිදහස වෙනුවෙන් පෙනී සිටීම: මාධ්‍යවේදීන් බිය ගැන්වීමට සහ භාෂණයේ නිදහස යටපත් කිරීමට යොදාගත් මර්දනකාරී නීතිමය ප්‍රතිපාදනයක් ඉවත් කරමින්, 2002දී සාපරාධී අපහාස නීතිය අහෝසි කිරීමට ද උද්දේශන ව්‍යාපාර හේතු විය. මෙම උද්දේශන ජයග්‍රහණය ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළේය.

ශ්‍රී ලංකාවේ සාර්ථක උද්දේශන ව්‍යාපාර පිළිබඳ උදාහරණ බොහෝය. දූෂණ මර්දනය වෙනුවෙන් වර්තමානයේදී සිදුවන උද්දේශනය එවැන්නකි. දේශපාලන පක්ෂ, සිවිල් සමාජය, ජනමාධ්‍ය ආදිය ඔස්සේ සිදුවන උද්දේශනය හේතුවෙන් 2023 වසරේදී රජය විසින් 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත හඳුන්වා දෙන ලදි. එය එම උද්දේශනයේ සාර්ථක සන්ධිස්ථානයකි. අතීතයේදී දූෂණය ඔස්සේ උපයාගන්නා ලද දේපළ ආපසු ලබාගැනීම සඳහා නීති හා ක්‍රියාමාර්ග සම්පාදනය කිරීමේ උද්දේශනයක් ක්‍රියාත්මක වෙමින් තිබේ.

ශ්‍රී ලංකාවේ අසාර්ථකම උද්දේශනයන් අතරින් එකක් ලෙස සැලකිය හැක්කේ ජාතීන්ගේ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලෙස බලය බෙදී යන රාජ්‍ය ප්‍රතිසංස්කරණයක් සඳහා උද්දේශනයයි. දශක ගණනාවක් තිස්සේ සිදුකෙරෙන මෙම උද්දේශනයෙහි යම් සාර්ථකත්වයක් 1987දී 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හා පළාත් සභා හඳුන්වා දීම ඔස්සේ සිදු විය. එහෙත්, දශක හතරක් තිස්සේ ශ්‍රී ලංකාව එතනින් ඔබ්බට යාමට අසමත්ව සිටියි. සාමය ගොඩනැගීම නමින් ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රජාව අති විශාල ධනස්කන්ධයක් වැය කළ මුත් එයින් අත් වූ ප්‍රතිඵල ප්‍රශ්නකාරීය.

## උද්දේශනය හා ප්‍රවර්ධනය

උද්දේශනය හා ප්‍රවර්ධනය අතර සමීප සම්බන්ධතාවක් තිබේ. යම් උද්දේශනයක් වෙනුවෙන් සහාය ලබා ගැනීමට දෘශ්‍යතාව හෙවත් එය සමාජයට ප්‍රදර්ශනය වීම අවශ්‍ය වූ විට ප්‍රවර්ධනය ප්‍රයෝජනවත් වේ. නිදසුනක් වශයෙන්, පරිසර සංරක්ෂණය සඳහා අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාරයක් තුළ උද්දේශනය සහ ප්‍රවර්ධනය කිරීම යන දෙකෙහිම අංග ඇතුළත් වේ.

වෙනස අවබෝධ කර ගැනීම හා සමාජ වෙනසක් ඇති කිරීම වෙනුවෙන් උද්දේශනය ද උනන්දුව සහ නියැලීම උත්පාදනය කිරීම සඳහා ප්‍රවර්ධනය ද ඉවහල් වේ. උද්දේශන උත්සාහයන් අපේක්ෂිත ඉලක්ක සමඟ පෙළගැසෙන බව සහතික කිරීමට ප්‍රවර්ධනය උපකාරී වේ.

ජනගහන පාලනය වෙනුවෙන් පවුල් සංවිධාන සංගමය හරහා මෙහෙයවන ලද 'පුංචි පවුල රත්තරන්' තේමාවෙන් කැටි කරගත් ප්‍රවර්ධන ව්‍යාපාරය එවැන්නකි. 1970 දශකයේ මුල් භාගයේදී ශ්‍රී ලංකාව එතෙක් භාවිතා කළ අඩි, සැතපුම්, රාත්තල්, ගැලුන් වැනි කිරුම් මිනුම් ඒකක වෙනුවට මෙට්‍රික් ඒකක භාවිතයට ගැනීමට තීරණය කරන ලදි. ඒ සමග සිදු වූ උද්දේශනය හා ප්‍රවර්ධනය මහජනයා අතර සාර්ථක පරිවර්තනයකට ඉවහල් විය. මෙරට ජනතාව අතර වැසිකිළි භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකරන ලද කාර්යයන් ද තවත් සාර්ථකත්වයේ උදාහරණයකි. නිවසක රජයේ ආධාර මගින් ඉදිකරන ලද ජල මුද්‍රිත වැසිකිළියක් භාවිතය සඳහා පවුලේ අය පෙළැඹෙන ආකාරය පිළිබඳ කේ. ජයතිලක සූරීන් විසින් ලියන ලද මනරම් කෙටිකතාවක් ද තිබේ. එහි මාතෘකාව 'අපටත් වැසිකිළියක්' වේ.

සැලසුම් නොකළ ගැබ්ගැනීම්වලින් මෙන්ම, ලිංගිකව සම්ප්‍රේෂණය වන එච්අයිවී වැනි ආසාදනවලින් ද ආරක්ෂා වීම සඳහා කොන්ඩම් භාවිතය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ඇති ප්‍රවර්ධන ව්‍යාපාරය ද ආකර්ශනීය එකකි.


උද්දේශන ව්‍යාපාර විසින් අනුගමනය කරනු ලබන උපායමාර්ග, උපක්‍රම සහ අභියෝග විශ්ලේෂණය කිරීමෙන්, සාර්ථක මානව හිමිකම් උද්දේශනයකට දායක වන විවිධ සංරචක තේරුම් ගැනීමට අවස්ථාව ලැබේ. මෙම ප්‍රචාරණ ව්‍යාපාරයන් රාජ්‍යයක ප්‍රතිපත්ති හැඩගැස්වීමට දායක වී ඇති ආකාරය සහ අනාගත උද්දේශන ප්‍රයත්නයන් සඳහා ආදර්ශයන් ලෙස ක්‍රියා කරන ආකාරය ද අධ්‍යයනය කළ යුතුය.

# 3 ඵලදායී උද්දේශන සැලැස්මක් සංවර්ධනය කිරීම

**අරමුණ:**

**මානව හිමිකම් ආරක්ෂකයින් (HRD) තුළ උපාය මාර්ගික සහ ප්‍රායෝගික උද්දේශන සැලසුම් සැකසීමේ කුසලතා ගොඩනැගීම.**

## උද්දේශන සැලසුම් චක්‍රය හැඳින්වීම




ගැටලුව හඳුනාගැනීම ➢ ගැටලුව සහ ලබාදිය හැකි විසඳුම් විශ්ලේෂණය කිරීම ➢ පාර්ශ්වකරුවන් සහ පරිසරය තක්සේරු කිරීම ➢ අරමුණු සහ ඉලක්ක සැකසීම ➢ ප්‍රතිපත්තිමය ආස්ථානය හා ඉල්ලීම් පැහැදිලි කිරීම ➢ උපක්‍රම තෝරාගැනීම ➢ පණිවුඩ නිර්මාණය කිරීම ➢ උද්දේශන මූලෝපායක් ගොඩනැගීම ➢ ක්‍රියාත්මක කිරීම ➢ නැවත සලකා බැලීම, ප්‍රතිපෝෂණය ලබාගැනීම සහ නැවත සැකසීම

Advocacy Planning Wheel හෙවත් උද්දේශන සැලසුම් චක්‍රය යනු සාර්ථක උද්දේශන ව්‍යාපාරයක් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය පියවරයන් හරහා මානව හිමිකම් ආරක්ෂකයන්ට මග පෙන්වීම සඳහා නිර්මාණය කර ඇති උපාය මාර්ගික රාමුවකි. උද්දේශනය යනු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම අඛණ්ඩව සිදු කරන චක්‍රීය ක්‍රියාවලියකි. මෙම මෙවලම මගින් කළමනාකරණය කරගත හැකි පියවර මාලාවකට උද්දේශනය වෙන් කරයි. සෑම අදියරක්ම උපායමාර්ගික වේ. හිතාමතා සැලසුම් කෙරේ. මැනිය හැකි ප්‍රගතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්ක කරයි. උද්දේශන සැලසුම් චක්‍රය මානව හිමිකම් ආරක්ෂකයන් හට ගැටලු හඳුනා ගැනීම, පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම සහ පණිවිඩ නිර්මාණය ඇතුළු තීරණාත්මක පියවර ක්‍රමානුකූලව සැලසුම් කිරීමට උපකාර කරයි. සෑම උද්දේශන සැලැස්මක්ම හොඳින් සිදුකර ඇති බව සහ ඵලදායී බව සහතික කරයි.

## 1. ගැටලු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම

උද්දේශන සැලැස්මක් සැකසීමේ පළමු පියවර වන්නේ අවධානය යොමු කළ යුතු මූලික ගැටලු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමයි. මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හෝ සමාජ ගැටලු අතරින් වඩාත් හදිසි සහ ප්‍රජාවන්ට අදාළ වන්නේ කුමන ඒවාද යන්න මානව හිමිකම් ආරක්ෂකයා විසින් තීරණය කළ යුතුය. මෙයට ගැටලුව හඳුනා ගැනීම පමණක් නොව එහි යටින් පවතින හේතු සහ ලබාදිය හැකි විසඳුම් අවබෝධ කර ගැනීම ද ඇතුළත් වේ. පහත දැක්වෙන ප්‍රධාන ප්‍රශ්න මෙම ක්‍රියාවලියට මග පෙන්වයි:

- මෙම ගැටලුව අපගේ සංවිධානයේ මෙහෙවර සමග අනුකූලද?
- මෙම ගැටලුව අපගේ ඉලක්කගත ප්‍රජාවන්ට බලපාන්නේ කෙසේද?
- වෙනස් වීමේ අවශ්‍යතාවට අනුබල දෙන සාක්ෂි මොනවාද?

උද්දේශනය සඳහා ගැටලුව පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් අත්‍යාවශ්‍ය වේ. පර්යේෂණ සහ ප්‍රජා දායකත්වයන් මගින් එයට ශක්තිමත් පදනමක් නිර්මාණය කෙරේ. උද්දේශන සැලැස්ම මගින් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සහ පුළුල් පාර්ශවකරුවන් යන දෙඅංශයටම සම්බන්ධ අව්‍යාජ ප්‍රයත්නයන් නිර්මාණය වන බව මෙම අදියර විසින් සහතික කරයි.

උදාහරණයක් ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මානව හිමිකම් ආරක්ෂකයන්ගේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට දැඩිව බලපාන්නකි. එබැවින් එම පනත සංශෝධනය කිරීම සඳහා උද්දේශන ව්‍යපාරයක් අවශ්‍යය. 2024දී මෙම පනත කඩිමුඩියේ සම්මත කළ ද, සිවිල් සමාජයෙන් එල්ල වූ විරෝධය

නිසා එය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ආණ්ඩුව පිළිගත්තේය. ඔවුන් විසින් සංශෝධන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබේ. එය පිළිබඳ අධ්‍යයනය කර තවදුරටත් උද්දේශනය සිදුකළ යුතුය.

## 2. ඉලක්ක (goals) සහ අරමුණු (objectives) සැකසීම

ගැටලුව පැහැදිලිව නිර්වචනය කරගත් පසු, මානව හිමිකම් ආරක්ෂකයන් විසින් නිශ්චිත ඉලක්ක සහ අරමුණු හඳුනාගත යුතුය. ඉලක්ක යනු, උද්දේශන ව්‍යාපාරය මගින් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන දිගු කාලීන ප්‍රතිඵල වේ. එනම්, නීති ප්‍රතිසංස්කරණ හෝ මානව හිමිකම් ආරක්ෂාව වඩා හොඳින් ආරක්ෂා කිරීම වැනි කාරණාය. මේවා උද්දේශන සංවිධානයේ පුළුල් මෙහෙවර සමඟ සමපාත විය යුතුය.

අරමුණු යනු, මෙම අතිවිශාල ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන විශේෂිත, කෙටි කාලීන ක්‍රියාවන් වේ. හොඳින් අර්ථ දක්වා ඇති අරමුණු තුළ පහත දැක්වෙන ලක්ෂණ තිබේ:

- මැනිය හැකි: ප්‍රගතියේ ප්‍රමාණාත්මක බව මැනිය හැකි විය යුතුය
- යථාර්ථවාදී: පවතින සම්පත් සහ කාලය අනුව අරමුණු සාක්ෂාත් කරගත හැකි විය යුතුය.
- කාල සීමාව: එක් එක් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලි කාල රාමුවක් සහිත විය යුතුය.

පැහැදිලි අරමුණු සහිතව කටයුතු කිරීමෙන් උද්දේශන ව්‍යාපාරවල අවධානය මනාව අදාළ කරුණ වෙත යොමු වේ. සාර්ථකත්වය ඇගයීම සඳහා නිර්ණායක ලබා දීමට උපකාරී වේ. උදාහරණයක් ලෙස, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම වෙනුවෙන් පෙනී සිටීම ඉලක්කයකි. බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගෙන් අදහස් රැස් කිරීම සඳහා මාස හයක් ඇතුළත පාර්ශවකරුවන්ගේ උපදෙස් විමසීම් තුනක් සංවිධානය කිරීම අරමුණක් ලෙස සැලකිය හැකිය.

ඉලක්ක සහ අරමුණු පිළිබඳ වැඩිදුරටත් සාකච්ඡා කිරීමේදී ඉලක්කවල යථාර්ථවාදීභාවය පිළිබඳ උදාහරණයකින් පැහැදිලි කළ හැකිය. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් අතරින් එක් කොටසක් පෙනී සිටින්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මුළුමනින්ම අහෝසි කිරීම වෙනුවෙනි. ඔවුන් කියන්නේ, ත්‍රස්තවාදය සම්බන්ධ කාරණා සාමාන්‍ය නීතිය යටතේ ආමන්ත්‍රණය කළ හැකි බවයි. එහෙත්, රජය මේ පිළිබඳව පවසන්නේ, ත්‍රස්තවාදය ලොව පුරා පවතින

හා ශ්‍රී ලංකාවට ද බලපාන ගැටලුවක් වන බව හා ලොව බොහෝ රටවල් ත්‍රස්තවාදයට එරෙහි නීති සම්පාදනය කර තිබෙන සංදර්භයක් තුළ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති අවශ්‍ය නිසා කළ හැක්කේ අහෝසි කිරීම නොව, වඩා දියුණු ත්‍රස්ත විරෝධී නීතියක් හඳුන්වා දීම බවයි. මෙම සංදර්භය තුළ, දීර්ඝ කාලයක් තිස්සේ පවතින මෙම විසම්මුතිය මැද ආණ්ඩු විසින් වරින් වර හඳුන්වා දෙන ලද සාපේක්ෂව 'ධනාත්මක' ත්‍රස්ත විරෝධී පනත් සම්මත කරගැනීමට නොහැකි වූ අතර, වසර 40කට වැඩි කාලයක් තිස්සේ 1979 අංක 48 දරණ ත්‍රස්ත විරෝධී පනත ක්‍රියාත්මක වෙමින් පවතී. එහි තිබෙන ඇතැම් බරපතල ගැටලු සහගත තත්වයන්ට පමණක් විසඳුම් දුන් ප්‍රති ත්‍රස්ත පනත් කෙටුම්පත හා ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත වැනි යෝජනා ක්‍රියාත්මක කිරීමට විරුද්ධ වීමෙන් අවසානයේදී ලැබී තිබෙන ප්‍රතිඵලය කෙරෙහි අවධානය යොමු කරමින් ඉලක්ක හා අරමුණු පිළිබඳ සාකච්ඡා කළ හැකිය.

## 3. පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම (බලය/බලපෑම සහ උනන්දුව)

ඵලදායි උද්දේශනය රඳා පවතින්නේ ගැටලුවට බලපෑම් කිරීමට බලය ඇති ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ සම්බන්ධ කර ගැනීම මත ය. රජයේ නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, සිවිල් සමාජ කණ්ඩායම්, මාධ්‍යවේදීන්, මාධ්‍ය සහ සාමාන්‍ය ජනතාව පාර්ශවකරුවන් අතරට ඇතුළත් විය හැකිය. පාර්ශවකරුවන්ගේ බල මට්ටම හෝ ගැටලුව සම්බන්ධයෙන් ඇති බලපෑම සහ ප්‍රතිඵලය කෙරෙහි ඔවුන්ගේ උනන්දුවෙහි මට්ටම අනුව ඔවුන් සිතියම්ගත කරගැනීමේ වැදගත්කම උද්දේශන සැලසුම් චක්‍රය මගින් අවධාරණය කරයි.

ඉහළ බලයක් සහ ඉහළ උනන්දුවක් ඇති පාර්ශවකරුවන් යනු සාමාන්‍යයෙන් ප්‍රමුඛත්වය දිය යුතු ප්‍රධාන පාර්ශ්වකරුවන් වේ. නීති සම්පාදකයින් හෝ බලගතු සිවිල් සමාජ නායකයින් මේ අතරට ඇතුළත් විය හැකිය. පාර්ශවකරුවන් සිතියම්ගත කිරීම මගින් මානව හිමිකම් ආරක්ෂකයන් හට විවිධ ග්‍රාහකයන් සඳහා ඔවුන්ගේ උද්දේශන ප්‍රයත්නයන් උපායශීලීව සකස් කිරීම සඳහා අවස්ථාව ලබා දෙයි. පණිවිඩ, උපක්‍රම සහ ප්‍රවේශයන් එක් එක් කණ්ඩායම සඳහා සුදුසු බව සහතික කරයි. ගැටලුව සම්බන්ධයෙන් වඩාත්ම බලය සහ උනන්දුව ඇත්තේ කා අතරද යන්න තේරුම් ගැනීම මගින් උද්දේශන උත්සාහයන් හොඳින් ඉලක්ක කර ඇති බව සහතික කළ හැකිය. සාර්ථකත්වයේ ඉහළ සම්භාවිතාවක් ද සහතික කරයි.

වර්තමානයේදී උද්දේශනය සඳහා ඉතා පුළුල් ලෙස සමාජ මාධ්‍ය භාවිතා කෙරේ. එසේම, දේශපාලකයන්, රාජ්‍ය ආයතන වැනි ඉහළ බලයක් සහිත පාර්ශ්වකරුවන් බොහෝ දෙනෙකු සමාජ මාධ්‍ය භාවිතා කරති. බුද්ධිමත් ලෙස නව මාධ්‍ය හා සම්ප්‍රදායික මාධ්‍ය භාවිතා කිරීම මගින් සාර්ථක උද්දේශනයක් සැලසුම් කළ

හැකිය. හෑෂ්ටැග් භාවිතය, ටැග් කිරීම ආදී නව භාවිතාවන් එහිදී ඉතා වැදගත් වේ.

## 4. උපායමාර්ග (strategies) සංවර්ධනය කිරීම, උපක්‍රම (tactics) තෝරා ගැනීම සහ පණිවිඩ යැවීම

පාර්ශවකරුවන් හඳුනා ගැනීමෙන් පසුව, ඊළඟ පියවර වන්නේ උද්දේශන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ග සංවර්ධනය කිරීම සහ උපක්‍රම තෝරා ගැනීමයි. උපායමාර්ග යනු උද්දේශන ව්‍යාපාරය එහි අරමුණු වෙනුවෙන් ක්‍රියා කරන්නේ කෙසේද යන්න පිළිබඳ පුළුල් සැලසුම් වන අතර උපක්‍රම යනු එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට භාවිතා කරන නිශ්චිත ක්‍රියා වේ.

**පොදු උද්දේශන උපක්‍රම:**

- සාකච්ඡා මගින් බලපෑම් කිරීම හෙවත් ලොබි කිරීම: නීති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ සෘජුව සම්බන්ධ වී නීති සම්පාදනයට බලපෑම් කිරීම.

- මාධ්‍ය ක්‍රියාකාරකම්: මහජනතාව දැනුවත් කිරීම සහ තීරණ ගන්නන් මත පීඩනය යෙදීම සඳහා සම්ප්‍රදායික සහ සමාජ මාධ්‍ය වේදිකා භාවිතා කිරීම.

- මහජන ප්‍රචාරණ: රැලි, පෙත්සම්, හෝ මහජන දැනුවත් කිරීම් සංවිධානය කිරීම.

- ප්‍රජාව වෙත සමීප වීම: බිම් මට්ටමේ සහයෝගය බලමුළු ගැන්වීම සඳහා ප්‍රාදේශීය ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම.

මෙම මට්ටමෙහිදී, පණිවිඩ යැවීම ද ඉතා වැදගත් වේ. මානව හිමිකම් ආරක්ෂකයන් සෑම ප්‍රේක්ෂකයෙකුටම ගැලපෙන පැහැදිලි, සංක්ෂිප්ත සහ නිර්මාණාත්මක පණිවිඩ සකස් කළ යුතුය. ඵලදායි පණිවිඩ මගින් ගැටලුවේ හදිසිතාව සන්නිවේදනය කරයි, ක්‍රියාකාරී විසඳුම් ඉදිරිපත් කරයි. ඉලක්කගත පාර්ශවකරුවන්ගේ වටිනාකම් සහ අවශ්‍යතා සමඟ ඒවා සමපාත වේ. නිදසුනක් වශයෙන්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම වෙනුවෙන් උද්දේශනය කරන විට, මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා අන්තර්ජාල නිදහසේ වැදගත්කම අවධාරණය කළ යුතුය. එසේම, ජාතික ආරක්ෂාව සහ පුද්ගල අයිතිවාසිකම් යන දෙකම ආරක්ෂා කරන නීතිමය ප්‍රතිසංස්කරණ යෝජනා කළ යුතුය.

මානව හිමිකම් ආරක්ෂකයන් ඔවුන්ගේ කාර්යයට ක්‍රමානුකූල ආකාරයකින් ප්‍රවේශ වන බව උද්දේශන සැලසුම් චක්‍රය විසින් සහතික කරයි, එය උපායමාර්ගික, ක්‍රියාකාරී පියවරවලට වෙන් කිරීම ඔස්සේ උද්දේශන ක්‍රියාවලිය වඩාත් ඵලදායී හා බලපෑමෙන් යුක්ත තත්වයට පත් කරයි.

ප්‍රායෝගික අභ්‍යාසඃ කණ්ඩායමක් ලෙස, මූලික උද්දේශන සැලැස්මක් සකස් කර ඒ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් දැනුම හා කුසලතා වර්ධනය කරගත හැකිය.

# 4 උද්දේශන උපක්‍රම සහ මෙවලම්

**අරමුණ:**

> **මානව හිමිකම් ආරක්ෂකයන්ට ඵලදායී උද්දේශනය සඳහා භාවිතා කළ හැකි ප්‍රායෝගික මෙවලම් සහ ක්‍රම ගවේෂණය කිරීම.**

## සාකච්ඡා මගින් බලපෑම්

### පාර්ශවකරුවන් හඳුනා ගැනීම සහ සබඳතා ගොඩනැගීම

ඵලදායී උද්දේශනය ආරම්භ වන්නේ ගැටලුවට බලපෑම් කිරීමට බලය ඇති පාර්ශ්වකරුවන් හඳුනා ගැනීමෙනි. පාර්ශවකරුවන්ට රාජ්‍ය නිලධාරීන්, සිවිල් සමාජ සංවිධාන, ප්‍රජා නායකයින්, මාධ්‍ය ආයතන සහ සාමාන්‍ය ජනතාව වැනි පුළුල් පරාසයක පුද්ගලයන් සහ කණ්ඩායම් ඇතුළත් වේ. මෙම පාර්ශවකරුවන් හඳුනාගත් පසු, ඔවුන්ගේ බලපෑමේ මට්ටම සහ ගැටලුව සම්බන්ධයෙන් ඔවුන්ගේ උනන්දුව යන දෙකම තක්සේරු කිරීම ඉතා වැදගත් වේ.



පාර්ශවකරුවන්ගේ බලය සහ උනන්දුව මත පදනම්ව ඔවුන් මෙසේ සිතියම්ගත කිරීම මගින් මානව හිමිකම් ආරක්ෂකයන් හට ඔවුන්ගේ උද්දේශන ප්‍රයත්නයන් වඩාත් බලපෑම්කාරී පුද්ගලයන් සහ කණ්ඩායම් වෙත යොමු කිරීමට හැකි වේ. මෙම මූලෝපායික ඉලක්කගත කිරීම මගින් උද්දේශන ප්‍රයත්නයන් වෙනස්කම් ඇති කිරීමට බොහෝ දුරට හැකියාව ඇති අය වෙත යොමු කළ හැකිය. මෙම පාර්ශ්වකරුවන් සමඟ ශක්තිමත් සබඳතා ගොඩනඟා ගැනීම ද ඒ හා සමානව වැදගත් වේ. උද්දේශනය බොහෝ විට දැනටමත් පවතින පද්ධති තුළ ක්‍රියාත්මක වේ. එයින් අදහස් කරන්නේ සංවාදය, සාකච්ඡා සහ සහයෝගීතාවය තුළින් තීරණ ගන්නන් සම්බන්ධ කර ගැනීමයි.

සබඳතා ගොඩ නැගීම සහ පවත්වාගෙන යාම සඳහා අන්‍යෝන්‍ය ගෞරවය, විශ්වාසය සහ විනිවිදභාවය අවශ්‍ය වේ. මානව හිමිකම් ආරක්ෂකයන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී එක් එක් පාර්ශවකරුවන්ගේ භූමිකාව සහ මානව හිමිකම් ඉලක්ක ඉදිරියට ගෙන යාමට ඒ අයට දායක විය හැකි ආකාරය අවබෝධ කර ගත යුතුය. දිගුකාලීන හවුල්කාරිත්වයන් වර්ධනය කර ගැනීමෙන්, මානව හිමිකම් ආරක්ෂකයන්හට ඔවුන්ගේ උද්දේශන උත්සාහයන් පුළුල් කරගැනීමට ඉවහල් වන බලවත් සන්ධාන නිර්මාණය කරගත හැකිය.

## සාකච්ඡා මගින් බලපෑම් කිරීම, මාධ්‍ය සමග කටයුතු කිරීම සහ ජාලකරණය

සාකච්ඡා මගින් බලපෑම් කිරීම යනු නිශ්චිත මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ තීරණ ගන්නන් සමඟ ඔවුන්ගේ ස්ථාවරයට බලපෑම් කිරීම සඳහා සෘජුව, අරමුණු සහිතව සන්නිවේදනයකි. මානව හිමිකම් ආරක්ෂා කරන නීති, රෙගුලාසි සහ පොදු ප්‍රතිපත්ති සැකසීම සඳහා මෙම උද්දේශන උපක්‍රමය ඉතා වැදගත් වේ. නීති සම්පාදකයින් හෝ රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කරගත් විධිමත් රැස්වීම්, ඉදිරිපත් කිරීම්, හෝ පෙත්සම් ඇතුළු විවිධ ආකාරවලින් බලපෑම් කිරීමට හැකිය. මානව හිමිකම් ආරක්ෂා කිරීමේ අරමුණු සමග සමපාත වන පරිදි ප්‍රතිපත්තිමය වෙනස්කම් සුරක්ෂිත කිරීම සාකච්ඡා මගින් බලපෑම් කිරීමේ අරමුණයි. එහිදී නීති සංශෝධන හෝ නව මානව හිමිකම් ආරක්ෂණයන් හඳුන්වා දීම සිදුවිය හැකිය.

මාධ්‍ය සමග කටයුතු කිරීම යනු උද්දේශනයේ තවත් ප්‍රබල මෙවලමකි. මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධව කටයුතු කිරීමෙන්, මානව හිමිකම් ගැටලු පිළිබඳව දැනුවත් කිරීම, තීරණ ගන්නන්ට බලපෑම් කිරීම සහ මහජන මතය හැඩගැස්වීම සිදු කිරීමේ හැකියාව මානව හිමිකම් ආරක්ෂකයන්ට හා ඔවුන්ගේ ආයතනවලට ලැබේ. උද්දේශන ව්‍යාපාරවලට ඔවුන්ගේ අරමුණ ඉස්මතු කිරීමට සහ පුළුල් ග්‍රාහක පිරිසක් වෙත ළඟා වීමට පුවත්පත් නිවේදන, පුවත්පත් සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, ප්‍රවෘත්ති, ලිපි සහ මතවාද කතුවැකි ආදිය භාවිතා කළ හැකිය.

උද්දේශන පණිවිඩයක් විස්තාරණය කිරීමේදී සහ එය ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇති කළ හැකි අය වෙත ළඟා වන බව සහතික කිරීමේදී මාධ්‍ය සමග කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

උද්දේශන ප්‍රජාව තුළ සහයෝගීතාවය ගොඩනැගීමට සහ සම්පත් බෙදා ගැනීමට ජාලකරණය (Networking) උපකාර වේ. හොඳම භාවිතයන් හුවමාරු කර ගැනීමට, අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමට සහ සාමූහික ප්‍රයත්න ශක්තිමත් කිරීමට සමාන අදහස් ඇති සංවිධාන, සිවිල් සමාජ කණ්ඩායම් සහ ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වීමට මානව හිමිකම් ආරක්ෂකයන් හට හැකිය. ජාලකරණය මානව හිමිකම් ආරක්ෂකයන් හට ඔවුන්ගේ හඬ විස්තාරණය කරන සහ ඔවුන්ගේ සාර්ථකත්වය වැඩි කරන එක්සත් පෙරමුණක් ගොඩ නැගීමට අවස්ථාව ලබාදෙයි.

## උද්දේශනය සඳහා සමාජ මාධ්‍ය: අන්තර්ජාල වේදිකා උපරිම වශයෙන් භාවිතා කිරීම

(මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත වැනි නීති යටතේ අන්තර්ජාල නිදහස කෙරෙහි අවධානය යොමු කරමින්)

ෆේස්බුක්, ට්විටර්, යූ ටියුබ් සහ ටික්ටොක් වැනි සමාජ මාධ්‍ය වේදිකා උද්දේශනය සඳහා අත්‍යවශ්‍ය මෙවලම් බවට පත්ව ඇති අතර, මානව හිමිකම් ආරක්ෂකයන්ට විශාල ග්‍රාහක පිරිසක් වෙත ඉක්මනින් හා ඵලදායී ලෙස ළඟා වීමට එමගින් ඉඩ සලසයි. මෙම වේදිකා මගින් මානව හිමිකම් සම්බන්ධ තොරතුරු බෙදා හැරීමට, පාර්ශවකරුවන් සමඟ සෘජුව සම්බන්ධ වීමට සහ මානව හිමිකම් සඳහා බිම් මට්ටමේ සහාය බලමුළුගැන්වීමට මානව හිමිකම් ආරක්ෂකයන්ට හැකියාව ලැබේ. ශ්‍රී ලංකාවේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනතේ සන්දර්භය තුළ, අන්තර්ජාල නිදහස සහ ඩිජිටල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී සමාජ මාධ්‍ය උද්දේශනය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මගින් ඔන්ලයින් ප්‍රකාශනයට සීමාවන් හඳුන්වා දෙයි, සමාජ මාධ්‍ය උද්දේශන ප්‍රයත්නයන් සඳහා භාවිතා කිරීම දුෂ්කර තත්වයට පත්කරයි. පනතේ බලපෑම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට, පීඩාවට පත් වූවන්ගේ පුද්ගලික කථා බෙදා ගැනීමට සහ නීතිමය ප්‍රතිසංස්කරණ සඳහා මහජන බලපෑම් කිරීමේ අන්තර්ජාල ව්‍යාපාර සංවිධානය කිරීමට වුවද මානව හිමිකම් ආරක්ෂකයන්ට සමාජ මාධ්‍ය භාවිත කළ හැකිය. සමාජ මාධ්‍ය ප්‍රචාරණය මගින් මානව හිමිකම් ආරක්ෂකයන් සහ මහජනතාව අතර සංවාදයක් සඳහා අවකාශයක් ද ලැබේ. අන්තර්ජාල නිදහස සම්බන්ධ ගැටලු පිළිබඳව වැඩි දැනුවත්භාවයක් සහ සහයෝගීතාවයක් ද නිර්මාණය කරයි.

ඔන්ලයින් වේදිකා ඵලදායි ලෙස භාවිතා කිරීමෙන්, මානව හිමිකම් ආරක්ෂකයන්හට ඔවුන්ගේ ප්‍රවේශය සහ බලපෑම උපරිම කරමින් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත මගින් එල්ල වන අභියෝගවලට මුහුණ දිය හැකිය.

## උද්දේශන ද්‍රව්‍ය සංවර්ධනය කිරීම: වාර්තා, තොරතුරු ග්‍රැෆික්ස් සහ වීඩියෝ

සංකීර්ණ මානව හිමිකම් ගැටලු පැහැදිලි සහ බලගතු ආකාරයෙන් සන්නිවේදනය කිරීම සඳහා උසස් තත්ත්වයේ උද්දේශන ද්‍රව්‍ය අත්‍යවශ්‍ය වේ. විවිධ ආකාරයේ උද්දේශන ද්‍රව්‍ය ප්‍රේක්ෂකයින් සහ පණිවිඩය මත පදනම්ව විවිධ අරමුණු සඳහා සේවය කරයි.

- වාර්තා මගින් නිශ්චිත මානව හිමිකම් ගැටලු පිළිබඳ ගැඹුරු විශ්ලේෂණ, දත්ත සහ නිර්දේශ සපයයි. ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සවිස්තරාත්මක තොරතුරු අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්, නීති විශේෂඥයින් සහ තීරණ ගන්නන් සම්බන්ධ කර ගැනීම සඳහා ඒවා අත්‍යාවශ්‍ය  වේ. වාර්තා සම්පාදනය සඳහා හොඳින් පර්යේෂණ කළ යුතු අතර වාර්තා සාක්ෂි මත පදනම් වෙමින් ගැටලුව සම්බන්ධයෙන් පුළුල් දැක්මක් ඉදිරිපත් කළ යුතුය.

- ඉන්ෆොග්‍රැෆික්ස් මගින් සංකීර්ණ දත්ත පහසුවෙන් අවබෝධ කරගත හැකි දෘශ්‍ය ආකෘති බවට පරිවර්තනය කරයි. ඉක්මන්, බලපෑම් සහගත සන්නිවේදනයක් අවශ්‍ය වන මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරවලදී ඒවා විශේෂයෙන් ඵලදායී වේ. ඉන්ෆොග්‍රැෆික්ස් මගින් දත්ත සාරාංශ කිරීමට, ප්‍රධාන කරුණු උද්දීපනය කිරීමට සහ සංකීර්ණ ගැටලු සාමාන්‍ය ප්‍රේක්ෂකයින්ට වඩාත් පහසුවෙන් අවබෝධ කරවීමට හැකිය.

- වීඩියෝ යනු මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනයේදී මානුෂීය මානයන් ග්‍රහණය කර ගනිමින් කතන්දර කීම සඳහා යොදාගත හැකි ප්‍රබල මාධ්‍යයකි. සාක්ෂි, සිද්ධි අධ්‍යයනය හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ දෘශ්‍ය නිරූපණයන් ඔස්සේ, සංවේදනය ජනනය කිරීමට, දැනුවත් කිරීම ඉහළ නැංවීමට සහ ක්‍රියාකාරීත්වයට පෙළඹවීමට වීඩියෝවලට හැකිය. දෘශ්‍ය අන්තර්ගතයට වැඩි අවධානයක් යොමු වන සමාජ මාධ්‍ය වේදිකාවලදී ඒවා විශේෂයෙන් ඵලදායී වේ.

මෙම උද්දේශන ද්‍රව්‍ය දැනුවත් කිරීමට සහ අධ්‍යාපනය ලබාදීමට පමණක් නොව ක්‍රියාමාර්ග ගැනීමට පුද්ගලයින් සහ ආයතන පෙළඹවීමට ද ඉවහල් වේ. වාර්තා, ඉන්ෆොග්‍රැෆික්ස් සහ වීඩියෝවල සංකලනයක් භාවිතා කිරීමෙන්, මානව හිමිකම් ආරක්ෂකයන්ට විවිධ ප්‍රේක්ෂකයින් සම්බන්ධ කර ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරවල බලපෑම උපරිම කිරීමට හැකිය.

## ප්‍රායෝගික දැනුම

### පණිවුඩ නිර්මාණයට පහසු තාක්ෂණයන්

**Srimal DC** විසිනි

අන්තර්ගත නිර්මාණය යනු ඉලක්කගත ප්‍රෙක්ෂකයින් දැනුවත් කිරීමට, විනෝදාස්වාදය ලබාදීමට හෝ ඔවුන්ව සම්බන්ධ කර ගැනීමට බ්ලොග්, සමාජ මාධ්‍යය, වැනි ඩිජිටල් වේදිකා හරහා බෙදා හරිනු ලබන රූප, වීඩියෝ, ලිපි හෝ ඉන්ෆොග්‍රැෆික් වැනි විවිධ නිර්මාණයන් සැකසීමේ ක්‍රියාවලියයි.

වෘත්තිමය මට්ටමේ ඉහළ ගුණාත්වයෙන් යුතුව, පහසුවෙන් සහ වඩාත් ලාභදායීව ඔබගේ smrat phone එක හරහා ඉහත අන්තර්ගත නිර්මාණයන් සිදු කළ හැකි අතර ඒවා සමාජ මාධ්‍ය හරහා ඉලක්කගත ප්‍රජාව වෙත ගෙන යාමද ජංගම දුරකථනය හරහා පහසුවෙන් සිදු කර ගත හැකිය.

අන්තර්ගත නිර්මාණයක් කිරීමේදී එම නිර්මාණයට අදාළ ඉලක්කගත ග්‍රාහකයින් කවුරුන්ද යන්න සහ නිර්මාණය කිරීමේ අරමුණ ගැන සැලකිලිමත් විය යුතු අතර එම අරමුණට අදාළව නිර්මාණය සැලසුම් කළ යුතුය.

**ජංගම දුරකථනය භාවිතයෙන් වීඩියෝවක් පටිගත කිරීමට පෙර සැලකිලිමත් විය යුතු කරුණු.**

ජංගම දුරකථනය සුදානම් කර ගැනීම

**Free up storage**: පටිගත කරගන්නා වීඩියෝ දර්ශනයන් ගබඩා කරගැනීමට තරම් ප්‍රමාණවත් ධාරිතාවක් ජංගම දුරකතනයේ තිබිය යුතුය.

**Battery check**: බැටරිය හොඳින් ආරෝපිතව තිබීම හෝ power bank එකක් සුදානම්ව තබා ගැනීම.

**Update apps**: කැමරාවේ සහ සංස්කරණය සිදුකරන Apps යාවත්කාලීන කර තිබීම.

ගුණාත්වයෙන් යුතු වීඩියෝ දර්ශනයක් ලබා ගැනීම සඳහා අදාළ appsවල සැකසුම් නිසි පරිදි සකසා තිබීම. **(Choose the Right Settings)**

**Resolution: 1080p** වැනි ඉහළ resolution මට්ටමක කැමරා මෘදුකාංගය පවත්වා ගැනීම.

**Frame rate: fps** අගය 30 පවත්වා ගැනීම.

ජංගම දුරකථනය හරහා වීඩියෝ පටයක් සංස්කරණය කිරීම සඳහා විවිධ Apps වර්ග තිබේ. ඒ අතර CapCut, KineMaster, InShot යනාදී Apps අන්තර්ගත නිර්මාපකයන් අතර ප්‍රචලිතය. කුමන App එකක් භාවිතා කළද ජංගම දුරකතනයක් හරහා වීඩියෝ පටයක් සංස්කරණය කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදයන් එක හා සමානය.

## එහිදී භාවිතාවන පොදු features කිහිපයක්

01. Timeline

මෙය වීඩියෝ සංස්කරණය කිරීමේ මෘදුකාංගය තුළ තිබෙන ප්‍රධානම කොටසකි. සංස්කරණය කරන වීඩියෝ පටවලට එක් කිරීමට අවශ්‍ය Video, audio, photos යනාදී සියල්ල එක් රේඛාවකට ගෙන අවශ්‍ය පරිදි සංස්කරණය කිරීමට මේ හරහා පහසුකම ලැබී තිබේ.

02. Transition

වීඩියෝ සංස්කරණයේදී, එක් දර්ශනයකින් තවත් දර්ශනයකට සුමටව ගමන් කිරීමට භාවිතා කරන දෘශ්‍ය ප්‍රයෝග Transition ලෙස හැඳින්විය හැකිය. එය වීඩියෝවක විවිධ කොටස් සම්බන්ධ කිරීමට උදවු කරන අතර වීඩියෝව හරහා ඉදිරිපත් කෙරෙන අදහස අනුව භාවිතා කෙරෙන Transition එකෙහි ස්වභාවය වෙනස් වේ. ඉදිරිපත් කෙරෙන කතාන්දරයට සුමට ගලායාමක් ඇති කිරීම, නරඹන්නාට මඟ පෙන්වීම, කාලය ස්ථානය හෝ මනෝභාවයේ වෙනසක් අවධාරණය කිරීමට, වීඩියෝවේ ස්වභාවයට ගැලපෙන නිර්මාණාත්මක ස්පර්ශයක් එක් කිරීමට Transitions යොදා ගනී.

03. Import

වීඩියෝ, ශ්‍රව්‍ය, රූප හෝ වෙනත් ගොනු වීඩියෝ සංස්කරණ මෘදුකාංගයකට ගෙන ඒමේ ක්‍රියාවලිය import ලෙස හැඳින්වෙන අතර එය වීඩියෝවක් සංස්කරණය කිරීමේ පළමු පියවරයි.

04. Export

සංස්කරණය අවසන් කළ වීඩියෝව චක්‍ර කළ හැකි තනි ගොනුවක් ලෙස Save කර ගැනීමේ ක්‍රියාවලිය exporting ලෙස හැඳින්වේ. export කර අවසන් වූ පසු වීඩියෝව ග්‍රාහකයන් සමඟ බෙදා ගත හැකිය.

05. Add Text

වීඩියෝව හෝ එහි දර්ශන හඳුන්වා දීම, දෙබස් හෝ පරිවර්තන සඳහා, ප්‍රධාන කරුණු හෝ වැදගත් තොරතුරු ඉස්මතු කිරීම යනාදිය සඳහා වීඩියෝවකට අකුරු එකතු කිරීමට අවශ්‍ය වේ.

**භාවිතා කරන App එක අනුව වීඩියෝවට අකුරු එකතු කර ගන්නා ආකාරය.**

**1. CapCut**

Step 1: Tap on your video timeline and choose "Text."

Step 2: Select "Add Text" and type your words.

Step 3: Customize font, size, and color.

Step 4: Drag the text box to position it and set the duration on the timeline.

**2. InShot**

Step 1: Import your video and tap "Text."

Step 2: Add and type the text.

Step 3: Edit the font, color, and effects.

Step 4: Adjust the text duration by dragging it on the timeline.

**3. KineMaster**

Step 1: Tap "Layer" and then "Text."

Step 2: Type your words and press OK.

Step 3: Customize the text with animations, colors, and styles.

Step 4: Position and adjust timing on the timeline.

ග්‍රාහකයාට පහසුවෙන් කියවිය හැකි ආකාරයට සරල අකුරු සහ එකිනෙකට වෙනස් වර්ණ භාවිතා කිරීම, තිරය පිරී නොයන පරිදි වචන සීමා කිරීම, වැදගත්

දර්ශන ආවරණය නොවන පරිදි texts ස්ථානගත කිරීම, අකුරු සජීවිකරණය කිරීම යනාදිය හරහා වඩාත් ආකර්ෂණීය ලෙස වීඩියෝ පටය නිර්මාණය කර ගත හැකිවේ.

**Infographic යනු කුමක්ද?**

ඉන්ෆොග්‍රැෆික් යනු සංකීර්ණ තොරතුරු පහසුවෙන් තේරුම් ගැනීමට සහ ග්‍රාහකයින් ආකර්ෂණය කර ගැනීමට රූප, ප්‍රස්ථාර, අයිකන සහ අවම අකුරු ප්‍රමාණයක් භාවිතා කරමින් සකසනු ලබන නිර්මාණයකි. ඉන්ෆොග්‍රැෆික්ස් බොහෝ විට සංඛ්‍යාලේඛන, සැසඳීම්, කාල නියමයන් සහ අනෙකුත් දත්ත මත පදනම්ව දෘශ්‍යමය වශයෙන් සිත් ඇදගන්නා ආකාරයෙන් සහ තේරුම් ගැනීමට පහසු වන ආකාරයෙන් ඉදිරිපත් කෙරේ.

**Infographicsහි වාසි:**

සංකීර්ණ තොරතුරු සරල ලෙස ඉදිරිපත් කිරීම නිසා ග්‍රාහකයාට තේරුම් ගැනීමට සහ මතක තබා ගැනීමට පහසු කරයි. Inforgraphics ග්‍රාහකයාගේ අවධානය ඉක්මනින් ආකර්ෂණය කර ගන්නා බැවින් සමාජ මාධ්‍යවල බෙදා ගැනීමට ප්‍රේක්ෂකයින් වැඩි කැමැත්තක් දක්වයි. තොරතුරුවල ප්‍රධාන කරුණු එක බැල්මකින් ග්‍රහණය කර ගැනීමට infographics ඉඩ සලසන අතර ඉන් ග්‍රාහකයාගේ කාලය ඉතිරි කරයි.

**Infographics සැදීමේදී සලකා බැලිය යුතු කරුණු.**

01. නිර්මාණයේ ඉලක්කගත ප්‍රේක්ෂකයින් කවුරුන්ද යන්න දැන ගන්න. ඔබේ ප්‍රේක්ෂකයන්ගේ අවශ්‍යතා සහ මනාපයන්ට ගැළපෙන පරිදි ඔබේ නිර්මාණයේ ශෛලිය, භාෂාව සහ අන්තර්ගතය සකස් කරන්න.

02. තොරතුරු පැහැදිලි සහ පහසුවෙන් අවබෝධ කළ හැකි වන ලෙස පැහැදිලිව සහ සරලව නිර්මාණය සිදු කරන්න. නිර්මාණය ඕනෑවට වඩා අකුරු හෝ පින්තූර සමඟින් පිරවීමට යාමෙන් වළකින්න.

03. ඉන්ෆොග්‍රැෆික්හි ඇතුළත් කර ඇති සියලුම දත්ත සහ කරුණු නිවැරදි බවට සහතික කර ගන්න. වැරදි තොරතුරු නිසා ග්‍රාහකයා ඔබ කෙරෙහි තබා තිබෙන විශ්වසනීයත්වයට හානි සිදු විය හැකිය.

04. ස්ථාවර පෙනුමක් පවත්වා ගැනීම සඳහා නිර්මාණය පුරාවටම ස්ථාවර වර්ණ පටිපාටියක්, අකුරු සහ දෘශ්‍ය අංග භාවිතා කරන්න.

05. වැදගත්ම තොරතුරුවලට ප්‍රමුඛත්වය දෙන්න. තාර්කික අනුපිළිවෙලකට

අන්තර්ගතය හරහා නරඹන්නාට මඟ පෙන්වීම සඳහා ශීර්ෂයන්, bold text යනාදිය භාවිතා කරන්න.

06. සන්නාමයක් සඳහා ඉන්ෆොග්‍රැෆික් නිර්මාණය කරන්නේ නම්, සන්නාම අනන්‍යතාවයට අනුකූලවන ලාංඡන, වර්ණ සහ සැලසුම් අංග ඇතුළත් කරන්න.

ජංගම දුරකථනය හරහා Infographiccs නිර්මාණය කිරීමේදී Canva, Adobe Spark, Piktochart වැනි ජනප්‍රිය යෙදුම් භාවිතා කළ හැකිය. infographics නිර්මාණය කිරීම සඳහා තිබෙන ජංගම යෙදුම්වල (Mobile Apps) තිබෙන වඩාත්ම ප්‍රයෝජනවත් අංගයක් වන්නේ සැකිලි (availability of templates) තිබීමයි. එම සැකිලි කලින් සාදන ලද ඒවා වන අතර ඉක්මනින් infographic නිර්මාණය කිරීමට උදවු වේ. කලින් සකසන ලද සැකිලි නිර්මාණකරුට අවශ්‍ය ආකාරයට සිය infographics නිර්මාණයට ගැලපෙන ලෙස සම්පූර්ණයෙන්ම සකසා ගත හැකිය.

# 5 උද්දේශනයේ අවදානම් කළමනාකරණය

**අරමුණ:**

**උද්දේශනයේදී, විශේෂයෙන්ම එදිරිවාදී පරිසරයකදී, ඇති වන අවදානම් කළමනාකරණය කරන්නේ කෙසේදැයි අවබෝධ කරගැනීම.**

## මානව හිමිකම් ආරක්ෂකයන් සහ මාධ්‍යවේදීන් සඳහා ආරක්ෂක අවදානම් අවබෝධ කර ගැනීම

මානව හිමිකම් ආරක්ෂකයින් සහ මාධ්‍යවේදීන් බොහෝ විට ක්‍රියාත්මක වන්නේ ආරක්ෂක අවදානම් බහුලව පවතින, විශේෂයෙන් මානව හිමිකම් කඩකිරීම් බහුලව සිදුවන සහ ප්‍රකාශනයේ නිදහස යටපත් කර ඇති රටවල අධික අවදානම් සහගත පරිසරයන් තුළය. ශ්‍රී ලංකාව තුළ, මානව හිමිකම් ආරක්ෂකයෝ සහ මාධ්‍යවේදීහු බිය ගැන්වීම් සහ හිරිහැර කිරීම් ආදියේ සිට ශාරීරික හිංසනය සහ නීතිමය ප්‍රතිවිපාක දක්වා තර්ජනවලට මුහුණ දෙති. දූෂණය, වධහිංසා පැමිණවීම්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් සහ රාජ්‍ය බලය අනිසි ලෙස භාවිතා කිරීම වැනි සංවේදී කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන අයට මෙම අවදානම් විශේෂයෙන් ඉහළ ය.

රාජ්‍ය ක්‍රියාකාරීන්, දේශපාලන කණ්ඩායම් සහ අනෙකුත් බලගතු ආයතන බොහෝ විට මානව හිමිකම් ආරක්ෂකයන් හා මාධ්‍යවේදීන් ඉලක්ක කරති. එයට හේතුව වන්නේ, මානව හිමිකම් ආරක්ෂකයන් අපයෝජනයන්ට හෝ ස්ථාපිත බල ව්‍යූහයන්ට අභියෝග කරන බැවිනි. මෙම විරුද්ධත්වය ආවේක්ෂණය (sureveillance), අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ ශාරීරික ප්‍රහාර ඇතුළු විවිධ ආකාරවලින් ප්‍රකාශ විය හැකිය. ශ්‍රී ලංකාව මෑත කාලීනව ගෙන ආ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත, අන්තර්ජාල නිදහස සඳහා නව සීමා පැනවීම, ඩිජිටල් ආවේක්ෂණ අවදානම වැඩි කිරීම සහ මානව හිමිකම් ආරක්ෂකයන්ගේ සහ ඔවුන්ගේ උද්දේශන කටයුතු සඳහා මාර්ගගත වේදිකා භාවිතා කරන මාධ්‍යවේදීන්ට එරෙහිව දඬුවම් කිරීමේ ක්‍රියාමාර්ග වැඩි කිරීම නිසා එමගින් තත්ත්වය තවත් සංකීර්ණ වේ. එබැවින් මානව හිමිකම් ආරක්ෂකයෝ යුක්තිය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ඔන්ලයින් සහ ඕෆ්ලයින් යන දෙඅංශයෙන්ම එදිරිවාදී පරිසරයන්ට මුහුණ දෙති.

## දේශපාලන, නීතිමය සහ ආරක්ෂක අවදානම් අවම කිරීම

මානව හිමිකම් ආරක්ෂකයන් සහ මාධ්‍යවේදීන් මුහුණ දෙන අවදානම් අවම කිරීම සඳහා මනා සැලසුම් සහ ඵලදායී අවදානම් කළමනාකරණ උපායමාර්ග අවශ්‍ය වේ. රජයේ මැදිහත්වීම් හෝ පාලන තන්ත්‍ර වෙනස්වීම් සමඟ ඇතිවන අස්ථාවරත්වය වැනි දේශපාලන අවදානම් හේතුවෙන්, විශේෂයෙන් මැතිවරණ වැනි දේශපාලනික වශයෙන් සංවේදී කාලවලදී, උද්දේශන උත්සාහයන් කඩාකප්පල් විය හැකිය. දේශපාලන අවදානම් අවම කිරීම සඳහා, මානව හිමිකම් ආරක්ෂකයන් බලධාරීන් සමඟ නිර්මාණාත්මක සංවාදයක යෙදිය යුතුය, නීති විශේෂඥයින් සමඟ සබඳතා ගොඩනඟා ගත යුතුය. සහාය සහ යුක්තියුක්තභාවය ලබා දිය හැකි ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සමඟ සන්ධානගත විය යුතුය.

ප්‍රකාශනයේ නිදහස සීමා කරන සහ අන්තර්ජාල උද්දේශනය අපරාධයක් බවට පත් කරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත වැනි සීමාකාරී නීතිවලින් නීතිමය අවදානම් පැන නගී. මානව හිමිකම් ආරක්ෂකයන් සහ මාධ්‍යවේදීන් මෙම නීති තුළ ආරක්ෂිතව කටයුතු කිරීම සඳහා සහ ඇති විය හැකි නීතිමය ප්‍රතිවිපාක වළක්වා ගැනීම සඳහා ඒවා පිළිබඳව මනා දැනුමක් ලබාගත යුතුය. ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කරන අතරම උද්දේශන ක්‍රියාකාරකම් දේශීය නීතිවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා නීති උපදෙස් ලබා ගැනීම ඉතා වැදගත් වේ.

ප්‍රචණ්ඩත්වය, හිරිහැර කිරීම් සහ ශාරීරික ප්‍රහාර තර්ජන ඇතුළු ආරක්ෂක අවදානම් පුද්ගලික ආරක්ෂක පුහුණුව තුළින් යම් දුරකට අවම කර ගත හැක. අනතුරුදායක අවස්ථාවන්හිදී ආරක්ෂාව සලසාගන්නේ කෙසේද යන්න ඇතුළුව හදිසි ප්‍රතිචාර ප්‍රොටෝකෝල පිළිබඳව මානව හිමිකම් ආරක්ෂකයන් පුහුණු විය යුතුය. ඊට අමතරව, අවදානම් සහගත ස්ථානයෙන් ඉවත් වීම, නීතිමය සහාය සහ වෛද්‍ය ආධාර සඳහා හදිසි පියවර ඇතුළත් ශක්තිමත් ආරක්ෂක සැලැස්මක් නිර්මාණය කර ගැනීමෙන් මතුවිය හැකි ආරක්ෂක තර්ජනවල බලපෑම සැලකිය යුතු ලෙස අවම කළ හැකිය. ප්‍රචණ්ඩකාරී හෝ මර්දනකාරී ක්‍රියාවන් සිදුකරන විටදී එය මහජනතාව දැකීම වරදකරුවන්ට බාධාවක් ලෙස ක්‍රියා කළ හැකි බැවින්, උද්දේශන ක්‍රියාකාරකම්වල විනිවිදභාවය පවත්වා ගැනීම සහ මාධ්‍ය සගයන් සමග සම්බන්ධ වීම හරහා පෞද්ගලිකව ඉලක්ක කර ගැනීමේ අවදානම අවම කර ගැනීමට හැකිය.

## මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා ඩිජිටල් ආරක්ෂාවඃ සංවේදී තොරතුරු සහ පුද්ගලික ආරක්ෂාව සහතික කිරීම

ඩිජිටල්කරණය වූ වර්තමාන ලෝකයේ, මානව හිමිකම් ආරක්ෂකයන් හා මාධ්‍යවේදීන් සඳහා ඩිජිටල් ආරක්ෂාව අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් සයිබර් ප්‍රහාර සහ රාජ්‍ය ආවේක්ෂණය බහුලව පවතින රටවලදී එය ඉතා වැදගත් වේ. ඔන්ලයින් අවකාශය තුළ සංවේදී තොරතුරු සහ පුද්ගලික ආරක්ෂාව සලස්වා ගැනීම මගින් පුද්ගලයන් හෝ ජාලයන් අනවශ්‍ය අවදානමකට නිරාවරණය නොකර ඔවුන්ගේ උද්දේශන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සහතික කළ හැකි වේ.

සංවාද ආවේක්ෂණයෙන් ආරක්ෂා වීම සඳහා එන්ක්‍රිප්ට් කරන ලද පණිවුඩ ඇප් (උදාඃ සිග්නල්, ටෙලිග්‍රෑම්) වැනි ආරක්ෂිත සන්නිවේදන භාවිතාවන් පරිහරණය කළ කළ යුතුය. භාවිතා කරන උපාංග ශක්තිමත් මුරපද යොදා සුරක්ෂිත කළ යුතු අතර, මැල්වෙයා හෙවත් අනිෂ්ට මෘදුකාංග සහ අනවසරයෙන් ඇතුළුවීමේ උත්සාහයන්ගෙන් ආරක්ෂා වීමට සියලුම මෘදුකාංග නිතිපතා යාවත්කාලීන කළ යුතුය. මානව හිමිකම් ආරක්ෂකයන් අනාරක්ෂිත නාලිකා හරහා සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමෙන් වැළකී සිටිය යුතු අතර ඔවුන්ගේ ඩිජිටල් පියසටහන් අවම කිරීම සඳහා සමාජ මාධ්‍යවල ඔවුන්ගේ පොදු මැදිහත්වීම් සීමා කළ යුතුය.

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත වැනි දේශීය ඩිජිටල් නීති අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. මානව හිමිකම් ආරක්ෂකයන් ඔවුන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන අතරම ඒවා නීත්‍යානුකූල බව සහතික කළ යුතුය. සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් ප්‍රවේශමෙන් කළමනාකරණය කළ යුතු අතර, පුද්ගලික තොරතුරු සහ සංවේදී තොරතුරු නොසැලකිලිමත් ලෙස නිරාවරණය නොවන බවට සහතික විය යුතුය. මීට අමතරව, මානව හිමිකම් ආරක්ෂකයන් විසින් ඩිජිටල් උල්ලංඝනයකදී දත්ත අහිමි වීමෙන් ආරක්ෂා වීම සඳහා වැදගත් ලේඛන සහ දත්තවල බැකප් භෞතිකව සහ ක්ලවුඩ්වල තබාගත යුතුය.

අවසාන වශයෙන්, මානව හිමිකම් ආරක්ෂකයන් ආරක්ෂාව තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා සියලුම අන්තර්ජාල ගිණුම්වල ටූ ෆැක්ටර් ඔතෙන්ටිකේෂන් (2FA) වැනි ආරක්ෂාකාරී භාවිතයන් අනුගමනය කළ යුතුය. මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා ඩිජිටල් ආරක්ෂණ ප්‍රොටෝකෝල පිළිබඳ පුහුණුව අත්‍යවශ්‍ය වන අතර, එමගින් ඔවුන්ගේ සන්නිවේදනයේ සහ දත්තවල රහස්‍යභාවය පවත්වා ගනිමින් අන්තර්ජාල ප්‍රහාරවල සම්භාවිතාව අඩු කිරීමට සහ ඔවුන්ගේ වැඩ කටයුතු මනාව කරගෙන යාමට ඔවුන්ට හැකි වේ.

# 6 උද්දේශනයේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව

**අරමුණ:**

**මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් මුහුණ දෙන සුවිශේෂ අභියෝග තේරුම් ගෙන එම අභියෝගවලට මුහුණ දීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී උපායමාර්ග සංවර්ධනය කිරීම.**

## කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් උද්දේශනයේදී මුහුණ දෙන අභියෝග

මානව හිමිකම් වෙනුවෙන් උද්දේශන ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ට සහ සමාජභාවී සුළුතරයන්ට බොහෝ විට විවිධ අභියෝගවලට මුහුණ දෙන්නට සිදු වේ. මෙම අභියෝග ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැරවල සිට භෞතික සහ ඩිජිටල් අවකාශයන්හි වෙනස් කොට සැලකීම් දක්වා විහිදේ. මෙම කණ්ඩායම්වලට අයත් මානව හිමිකම් ආරක්ෂකයන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ලිංගික දිශානතිය හෝ සමාජභාවී අනන්‍යතාව හේතුවෙන් තර්ජනවලට මුහුණ දීමට ඇති ඉඩකඩ වැඩිය.

### 1. හිරිහැර සහ ප්‍රචණ්ඩත්වය

කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් වෙනුවෙන් පෙනී සිටින අය අසමානුපාතික ලෙස අන්තර්ජාලයේදී හා භෞතික ලෝකයේදී හිරිහැරවලට ඉලක්ක වේ. කායික ප්‍රචණ්ඩත්වය, ලිංගික හිරිහැර, බිය ගැන්වීම් සහ ස්ත්‍රී දූෂණ තර්ජන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ පොදු ආකාරයන් වේ. ඒවා ආරක්ෂිතව උද්දේශනයේ යෙදීමේ හැකියාව කෙරෙහි බලපායි. මෙම ප්‍රචණ්ඩ ක්‍රියා මගින් මානව හිමිකම් ආරක්ෂකයන් නිශ්ශබ්ද කිරීම සහ බිය ගැන්වීම අරමුණු කරගැනේ. ඒවා නිසා ඔවුන්ට ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන යාමට අපහසු වේ.

### 2. ඩිජිටල් තර්ජන සහ වැරදි තොරතුරු

සයිබර් හිරිහැර කිරීම සහ ඩොක්සිං (පෞද්ගලික තොරතුරු මාර්ගගතව අනවසරයෙන් ප්‍රසිද්ධ කිරීම) කාන්තාවන්ට සහ LGBTQ+ මානව හිමිකම්

ආරක්ෂකයන්ට අසමාන ලෙස බලපායි. බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන් ඉලක්ක කර ඩිජිටල් අවලාද ව්‍යාපාර දියත් වේ. එහි අරමුණ වන්නේ ඔවුන්ගේ කාර්යය අපකීර්තියට පත් කිරීම හෝ ඔවුන්ගේ අනන්‍යතා හෝ උද්දේශන ප්‍රයත්නයන් පිළිබඳ හානිකර වැරදි තොරතුරු පතුරුවා හැරීමයි.

**3. නීතිමය රාමු සහ වෙනස්කම් කිරීම**

සමාජභාවී සුළුතරයන් සහ කාන්තාවන් කොන් කරන හෝ ඔවුන්ට සමාන ආරක්ෂාවක් ප්‍රතික්ෂේප කරන නීතිමය රාමු තුළ අන්තර්ගත ආයතනික බාධකවලට මුහුණ දීමට ඔවුන්ට සිදු වේ. නීත්‍යානුකූල වෙනස්කම් සහ නීතිමය ආරක්ෂාවන් අවම වීම හේතුවෙන් වින්දිත මානව හිමිකම් ආරක්ෂකයන්ට යුක්තිය ලබාදීම දුෂ්කර වේ. එපමණක් නොව, අන්තර්ජාල ආරක්ෂාව හෝ මහජන සාමය සම්බන්ධ නීති බොහෝ විට ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන් මුහුණ දෙන අමතර අවදානම් තේරුම් ගැනීමට හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට අසමත් වේ.

## උද්දේශනය සහ අවදානම් කළමනාකරණය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් සංවේදී ප්‍රවේශයන්

මෙම විශේෂිත අභියෝගවලට මුහුණ දීම සඳහා, උද්දේශනයේ සහ අවදානම් කළමනාකරණයේ සියලු මට්ටම්වලදී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රවේශයන් ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ.

**1. උද්දේශන ව්‍යාපාර තුළට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතාව ඒකාබද්ධ කිරීම**

උද්දේශන සැලසුම්වලදී කාන්තාවන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී සුළුතරයන්ගේ විවිධ අවශ්‍යතා සහ දුර්වලතා සලකා බැලිය යුතුය. සියල්ලන් ඇතුළත් කරගන්නා භාෂාවක් භාවිතා කිරීමෙන්, සමාජභාවී සුළුතරයන්ගේ හඬ විස්තාරණය කිරීමෙන් සහ එම පුද්ගලයන්ට ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට ආරක්ෂිත අවකාශයන් නිර්මාණය කර දීමෙන් මානව හිමිකම් ආරක්ෂකයන් හට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී උද්දේශනයක් සහතික කළ හැකිය. විශේෂයෙන් ඩිජිටල් ආරක්ෂාව, ප්‍රජනක සෞඛ්‍යය, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීම වැනි කාරණා සම්බන්ධයෙන් කාන්තාවන්ගේ සහ සමාජභාවී සුළුතරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේද උද්දේශන උපායමාර්ග තුළ ඇතුළත් විය යුතුය.

## 2. අවදානම් කළමනාකරණය ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධ අවදානම්වලට ගැලපෙන පරිදි සකස් කිරීම

අවදානම් කළමනාකරණ උපායමාර්ග සංවර්ධනය කිරීමේදී, කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් මුහුණ දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂිත අවදානම් සම්බන්ධයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ. මෙම උපායමාර්ගවලට පහත දැක්වෙන කාරණා ඇතුළත් විය යුතුය:

- පුද්ගලික ආරක්ෂාව: කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් බොහෝ විට පොදු අවකාශයන්හිදී විශේෂිත තර්ජනවලට මුහුණ දෙති. අවදානම් කළමනාකරණ ප්‍රොටෝකෝලවලට කාන්තා මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා ආරක්ෂිත ප්‍රවාහන විකල්ප ඇතුළත් විය යුතු අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ තර්ජනවලට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳව ඔවුන්ට පුහුණුවක් ලබා දිය යුතුය.

- ඩිජිටල් ආරක්ෂාව: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්ව කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන් අන්තර්ජාල හිරිහැරවලට ලක්වීමට වැඩි ඉඩක් ඇති බැවින්, ඔවුන්ට උසස් ඩිජිටල් ආරක්ෂණ ක්‍රම පිළිබඳව පුහුණුව ලබාදිය යුතුය. එන්ක්‍රිප්ට් කරන ලද සන්නිවේදන මෙවලම් භාවිතය, සමාජ මාධ්‍යවල ප්‍රබල රහස්‍යතා සැකසීම් සහ ඔවුන්ගේ ඩිජිටල් අනන්‍යතා ඩොක්සිං සහ සයිබර් ප්‍රහාරවලින් ආරක්ෂා කර ගැනීමේ ක්‍රම මෙයට ඇතුළත් වේ.

- නීතිමය ආරක්ෂාව: ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට සහ වෙනස් කොට සැලකීමට එරෙහිව ශක්තිමත් නීති වෙනුවෙන් පෙනී සිටීම, සමාජභාවී සුළුතරයන් සහ කාන්තාවන් ආරක්ෂා කරන ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් කිරීම යන කරුණු කෙරෙහි නීතිමය උද්දේශනයේදී අවධානය යොමු කළ යුතුය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී අවදානම් කළමනාකරණය යනු නීතිමය ගැටලු අවබෝධ කර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී නීතිමය සහාය වෙත ප්‍රවේශ වීම සඳහා සම්පත් සහ සම්බන්ධතා මානව හිමිකම් ආරක්ෂකයන් වෙත සැපයීමයි.

# සිද්ධි අධ්‍යයන සහ උදාහරණ

## 1. සිද්ධි අධ්‍යනය: ශ්‍රී ලංකාවේ කාන්තා මාධ්‍යවේදිනියකට ඩිජිටල් හිරිහැර කිරීම

ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින ප්‍රකට මාධ්‍යවේදිනියක් රාජ්‍යය විසින් සිදුකරන ලද අපයෝජනයන් පිළිබඳව වාර්තා කිරීමෙන් පසු සයිබර් ප්‍රහාර

සහ හිරිහැරවලට ලක්විය. ඔන්ලයින් ට්‍රෝල් කරන්නන් ඇයගේ සමාජ මාධ්‍ය ගිණුම්වලට ලිංගික හා අපවාදාත්මක ප්‍රකාශයන්, පුද්ගලික තර්ජන ඇතුළත් කළ අතර මාධ්‍යවේදියෙකු ලෙස ඇයගේ විශ්වසනීයත්වය ප්‍රශ්න කළහ. මෙම ප්‍රහාරයන්ට ඇයගේ ගිණුම් හැක් කිරීමට උත්සාහ කිරීම සහ ඇයගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ වැරදි තොරතුරු පතුරුවන මඩ ව්‍යාපාර ද ඇතුළත් විය.

- ප්‍රතිචාරය: මාධ්‍යවේදිනිය එන්ක්‍රිප්ටඩ් මෙවලම් භාවිත කළ අතර ඇයගේ අන්තර්ජාල ආරක්ෂාව ශක්තිමත් කිරීමට ඩිජිටල් හිමිකම් සංවිධාන සමඟ කටයුතු කළාය. මීට අමතරව, ඇය මාධ්‍ය කර්මාන්තයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ඔන්ලයින් හිරිහැර පිළිබඳව දැනුවත් කිරීම සඳහා දේශීය උද්දේශන කණ්ඩායම් සමඟ හවුල් වූවාය. ඇයගේ උද්දේශනය ශ්‍රී ලංකාවේ කාන්තා මානව හිමිකම් ආරක්ෂකයන් සඳහා ඩිජිටල් ආරක්ෂණ ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවය පිළිබඳ මහජන කතිකාවක් නිර්මාණය කිරීමට හේතු විය.

# 7 දේශගුණික විපර්යාස සහ මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනය

**අරමුණ:**

**දේශගුණික විපර්යාස සහ මානව හිමිකම් අතර සම්බන්ධය තේරුම් ගැනීම සහ දේශගුණික විපර්යාසවල බලපෑම අවදානමට ලක්විය හැකි ජනගහනයට අසමාන ලෙස බලපාන ආකාරය ගවේෂණය කිරීම. මානව හිමිකම් කටයුතුවලට පාරිසරික යුක්තිය ඇතුළත් කරන උද්දේශන උපායමාර්ග සංවර්ධනය කිරීම.**

## මානව හිමිකම් මත දේශගුණික විපර්යාස බලපෑම

දේශගුණික විපර්යාස පාරිසරික ගැටලුවක් පමණක් නොව මානව හිමිකම් සම්බන්ධයෙන් ද සැලකිය යුතු අභියෝගයකි. දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් සමහරක් නම්, මුහුදු මට්ටම ඉහළ යාම, ආන්තික කාලගුණික සිදුවීම් සහ වෙනස් වන පරිසර පද්ධති ආදියයි. ඒවා සෘජුවම පුද්ගලයන්ගේත්, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේත් ජීවනෝපාය, සෞඛ්‍යය සහ ආරක්ෂාවට තර්ජන කරයි. දේශගුණය නිසා ඇතිවන අවතැන් වීම් හේතුවෙන් ආහාර අනාරක්ෂිතභාවය සහ ස්වභාවික විපත්වලට නිරාවරණය වීම සිදු වේ. එමගින් ජීවත්වීමට ඇති අයිතිය, සෞඛ්‍යය, නිවාස හා පිරිසිදු ජලය සඳහා ඇති ප්‍රවේශය වැනි මූලික මානව හිමිකම්වලට හානි වන තත්ත්වයන් නිර්මාණය කරයි.

### 1. අවතැන් වීම සහ නිවාස අයිතිය

දේශගුණික විපර්යාස නරක අතට හැරෙන විට, විශේෂයෙන් ස්වභාවික විපත්වලට ගොදුරු වන පහත් බිම්වල වෙරළබඩ ප්‍රදේශවල ජීවත් වන බොහෝ ප්‍රජාවන් අවතැන් වීමට මුහුණ දෙති. ගංවතුර, මුහුදු මට්ටම ඉහළ යාම සහ නියඟය හේතුවෙන් නිවාස අහිමි වීම ප්‍රජාවන්ට සංක්‍රමණය වීමට බල කරයි, නාගරික ප්‍රභදේශවල සහ සරණාගත කඳවුරුවල තදබදයට මඟ පාදයි. අවතැන් වීම හේතුවෙන් ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතිය උල්ලංඝනය වේ. ආරක්ෂිත සහ දැරිය හැකි වියදමකින් නවාතැන් සොයා ගැනීමට අවතැන් වූවන්ට සිදු වේ.

### 2. ජලය සඳහා ප්‍රවේශය සහ සෞඛ්‍යයට ඇති අයිතිය

නියඟය සහ ගංවතුර වැනි ආන්තික කාලගුණික තත්ත්වයන් පිරිසිදු ජලය සඳහා ප්‍රවේශයට බාධා කරයි. අවදානමට ලක්විය හැකි ජනගහනයේ සෞඛ්‍යය අවදානමට ලක් කරයි. දරිද්‍රතාව හෝ භූගෝලීය හුදකලාව නිසා දැනටමත් කොන් කර ඇති ප්‍රජාවන් බොහෝ විට දැඩි ලෙස පීඩාවට පත් වන අතර දේශගුණික විපර්යාස හේතුවෙන් දැනටත් පවතින අසමානතාවන් උග්‍ර වේ. පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය නොමැතිකම හේතුවෙන් ජලයෙන් ආසාදනය වන රෝග ඇතිවීමේ අවදානම වැඩි වේ. ජල මූලාශ්‍ර හිඟකම නිසා ජල පරිභෝජනය සම්බන්ධයෙන් ගැටුම් ඇති විය හැක.

### 3. ආහාර සුරක්ෂිතතාව සහ ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ඇති අයිතිය

දේශගුණික විපර්යාස කෘෂිකාර්මික පද්ධති අවුල් කරයි. එමගින් ආහාර අනාරක්ෂිතභාවය වැඩි වේ. අවදානමට ලක්විය හැකි ජනගහනයන්ට ප්‍රමාණවත් තරමින් ගුණාත්මක ජීවන තත්වයක් පවත්වා ගැනීමට නොහැකි වේ. දිගුකාලීන නියඟ සහ අකල් වර්ෂාපතනය ඇති වීම වැනි කාලගුණික රටා වෙනස් වීම හේතුවෙන් බෝග අස්වැන්න අඩු වන අතර ආහාර ලබා ගැනීමේ හැකියාව අඩු කරයි. මෙය ගොවීන්ට පමණක් නොව පෝෂණය සඳහා දේශීය කෘෂිකර්මාන්තය මත යැපෙන ප්‍රජාවන්ට ද බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන ආහාර අනාරක්ෂිතභාවය මන්දපෝෂණය සහ සාගින්න වැඩි කිරීමට හේතු විය හැකි අතර, ජනගහනයේ මානව හිමිකම් තවදුරටත් අඩපණ කරයි.

## දේශගුණික විපර්යාස නිසා පීඩාවට පත්වන අවදානම් ජනගහනයන්

සුළුතර ජනවාර්ගික කණ්ඩායම්, ආදිවාසී ජනතාව, කාන්තාවන් සහ ළමුන් ඇතුළු අවදානමට ලක්විය හැකි ජනගහනයට දේශගුණික විපර්යාස අසමාන ලෙස බලපායි. මෙම කණ්ඩායම් බොහෝ විට පාරිසරික වෙනස්වීම්වලින් වඩාත් බලපෑමට ලක් වන කලාපවල ජීවත් වන අතර දේශගුණය ආශ්‍රිත කම්පනවලට අනුවර්තනය වීමට හෝ යථා තත්ත්වයට පත් වීමට අවශ්‍ය සම්පත් ඔවුන්ට ප්‍රමාණවත් නැත.

### 1. ආදිවාසී ප්‍රජාවන්

ආදිවාසී ප්‍රජාවන් බොහෝ විට තම ජීවනෝපාය සඳහා භූමිය මත යැපෙන අතර දේශගුණික විපර්යාස ඔවුන්ගේ ජීවන රටාවට සෘජු තර්ජනයක් එල්ල කරයි. මුහුදු මට්ටම ඉහළ යාම, වන විනාශය සහ ජෛව විවිධත්වය නැතිවීම වැනි හේතු මත ආදිවාසී ජනතාව යැපෙන පරිසර පද්ධති විනාශ වේ. මෙම ප්‍රජාවන් තම පාරම්පරික ඉඩම් වාසයට නුසුදුසු තත්ත්වයට පත්වීමත්, පරිසරය හා

බැඳුණු ඔවුන්ගේ සංස්කෘතික භාවිතයන් කඩාකප්පල් වීමත් නිසා පාරිසරික හා සංස්කෘතික අලාභයන්ට මුහුණ දෙති.

### 2. කාන්තාවන් සහ සමාජභාවී සුළුතරයන්

විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සිටින කාන්තාවන්ට ආහාර සහ ජලය වැනි ගෘහ සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම පැවරී ඇත. දේශගුණික විපර්යාස හේතුවෙන් මෙම සම්පත් ක්ෂය වන විට, අමතර ශ්‍රම සහ සෞඛ්‍ය අවදානම් සම්බන්ධයෙන් කාන්තාවන්ට අසමාන බරක් දැරීමට සිදු වේ. සමාජ සම්මතයන් හෝ වෙනස් කොට සැලකීමේ පිළිවෙත් මත පදනම්ව ඉඩම් සහ සහනාධාර වැනි සම්පත් සඳහා ප්‍රවේශය ප්‍රතික්ෂේප කළ හැකි බැවින් සමාජභාවී සුළුතරයන් අමතර අවදානම්වලට ද මුහුණ දිය හැකිය.

### 3. අඩු ආදායම්ලාභී ප්‍රජාවන්

දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රජාවන් බොහෝ විට ජීවත් වන්නේ ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති ප්‍රදේශවලය. ඔවුන් දේශගුණය ආශ්‍රිත ආපදාවන්ට ගොදුරු වීමේ අවදානම වැඩි වේ. නිසි නිවාස, සෞඛ්‍ය සේවා හෝ සම්පත් සඳහා ප්‍රවේශයක් නොමැති හෙයින්, මෙම ප්‍රජාවන්ට පාරිසරික වෙනස්කම්වලට ඔරොත්තු දීමේ හැකියාව අඩුය. දේශගුණය නිසා ඇතිවන අවතැන් වීම මෙම ජනගහනයට අසමානුපාතික ලෙස බලපාන අතර, ඔවුන්ට සමාජ සේවා හෝ නීතිමය ආරක්ෂාව සඳහා ප්‍රවේශය නොමැති ප්‍රදේශවලට සංක්‍රමණය වීමට සිදු වේ.

## පාරිසරික යුක්තිය වෙනුවෙන් උද්දේශනය මානව අයිතිවාසිකමක් ලෙස

දේශගුණික විපර්යාස සම්බන්ධ උද්දේශනය නිතැතින්ම අවදානමට ලක්විය හැකි ජනගහනයේ මානව හිමිකම් සමඟ සම්බන්ධ වේ. පාරිසරික යුක්තිය වෙනුවෙන් පෙනී සිටීම යන්නෙන් අදහස් වන්නේ දේශගුණික විපර්යාසවල බර ඊට අවම වශයෙන් වගකිව යුතු ජනයා මත අසමාන ලෙස පටවන්නේ නැති බව සහතික කිරීමයි. දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කරන, පරිසර පද්ධති ආරක්ෂා කරන සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම්වලට ප්‍රමුඛත්වය දෙන ප්‍රතිපත්ති වෙනුවෙන් පෙනී සිටීමෙන් මානව හිමිකම් ආරක්ෂකයින්ට පාරිසරික යුක්තිය ආමන්ත්‍රණය කළ හැකිය.

### 1. දේශගුණික විපර්යාස විසින් සිදුකරනු ලබන අවතැන්වීම සම්බන්ධ උද්දේශනය

ජාත්‍යන්තර නීතිය යටතේ දේශගුණික සරණාගතයින්ට පිළිගැනීම ලබා දීම වෙනුවෙන් උද්දේශනය මගින් දේශගුණික හේතු මත අවතැන් වූ ජනගහනයේ

අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට උද්දේශන ව්‍යාපාරවලට හැකිය. අවතැන් වූ පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳ නීතිමය ගැටලු පෙන්වා දීමෙන්, පාරිසරික සාධක හේතුවෙන් අවතැන් වූවන්ට ප්‍රමාණවත් නිවාස, සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය සහ ඔවුන්ගේ රටවල දේශගුණික සරණාගතයන්ට නීතිමය පිළිගැනීම සහතික කිරීම වෙනුවෙන් මානව හිමිකම් ආරක්ෂකයන්ට ක්‍රියා කළ හැකිය.

**2. තිරසාර සම්පත් කළමනාකරණය සඳහා උද්දේශනය**

දේශගුණික විපර්යාස හේතුවෙන් ජල සම්පත් තර්ජනයට ලක්ව ඇති ප්‍රදේශවල, තිරසාර ජල කළමනාකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් උද්දේශනය කළ හැකිය. කොන් කරන ලද ජන කණ්ඩායම් සඳහා පිරිසිදු ජලය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙන විසඳුම් සංවර්ධනය කිරීම සඳහා මානව හිමිකම් ආරක්ෂකයන්ට ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකිය. එමගින් ජලය හිඟ කාලවලදී පවා ජලය සඳහා ඇති මානව අයිතියට ගරු කරන බව සහතික කරයි.

**3. දේශගුණික වගවීම සඳහා නීතිමය උද්දේශනය**

දේශගුණික විපර්යාසවලට දායක වන ක්‍රියාවන් සඳහා සමාගම්, රජයන් සහ අන්තර් රාජ්‍ය සංවිධාන වගකිව යුතු තත්වයට පත් කරන ශක්තිමත් නීතිමය රාමු සඳහා මානව හිමිකම් ආරක්ෂකයන් උද්දේශනය කළ යුතුය. කාබන් විමෝචනය අඩු කිරීම, හරිත බලශක්ති මූලාරම්භයන් ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික රෙගුලාසි බලාත්මක කිරීම සහතික කිරීම සඳහා ආයතනික වගකීම් සඳහා බලපෑම් කිරීම නීතිමය උද්දේශනයට ඇතුළත් විය හැකිය.

**4. අධ්‍යාපනය සම්බන්ධ උද්දේශනය**

විශේෂයෙන්ම ළමුන්ගේ අධ්‍යාපනය සම්බන්ධ බාධා ඇති වීම බොහෝ දේශගුණික විපර්යාස හමුවේ දැකිය හැකි පොදු ගැටලුවකි. නාය යෑම්, ගංවතුර යනාදිය හමුවේ පාසැල් ගොඩනැගිලි විනාශ විය හැකිය. එමෙන්ම ළමුන්ගේ පෙළ පොත්, නිල ඇඳුම් යනාදිය විනාශ වී යාමෙන් අධ්‍යාපන ක්‍රියාවලියට බාධා ඇති විය හැකිය.

**5. සෞඛ්‍යමය, සනීපාරක්ෂාව හා ආහාර සුරක්ෂිතභාවය සම්බන්ධ උද්දේශනය**

දේශගුණික විපර්යාස හමුවේ සිදුවන නාය යෑම්, ගංවතුර යනාදිය නිසා ජනතාවගේ සනීපාරක්ෂාව කෙරෙහි බලපෑම් ඇතිවීම හරහා සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තුළ ජීවත් වීමේ මානව අයිතියට බලපෑම් සිදුවේ. එවැනි අවස්ථාවලදී සරණාගත කඳවුරුවල ජනතාවට රැඳී සිටීමට සිදුවන බැවින් එහිදී කාන්තාවන්ට

සහ ළමුන්ට සෞඛ්‍ය සම්පන්න පරිසරයක් තුළ ජීවත් වීමේ අයිතිය අභියෝග යට ලක්විය හැකිය. විශේෂයෙන්ම කාන්තාවන්, ගැහැණු ළමයින්, ගර්භණී කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයන් සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව වැනි අය මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් උද්දේශනය ඉතා වැදගත්ය.

ජල මූලාශ්‍ර වලට හානි සිදු වීම නිසා පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ ගැටලුව මහජනතාවට මුහුණ පෑමට සිදු විය හැකිය.

දේශගුණික විපර්යාස හමුවේ බලපෑමට ලක්වන ප්‍රධානම කණ්ඩායමක් වනුයේ ගොවීන්ය. දේශගුණික විපර්යාස හමුවේ වර්ෂා රටාවේ වෙනස් වීම්, උෂ්ණත්ව වෙනස්වීම්, සමුද්‍ර ඛාදනය යනාදිය හරහා ගොවීන්ගේ වගාවන්ට හානි සිදු වීම සිදු විය හැකිය. මේ හරහා කෘෂි වගාවන් විනාශ වීම නිසා ආහාර සුරක්ෂිතතාවයට බලපෑම් සිදු විය හැකිය. එය බොහෝ දුරට ආහාර අර්බුදයක් දක්වා වුවද යාමේ ඉඩක් තිබේ. ඒ අනුව එය මහජනතාවගේ පෝෂණය කෙරෙහිද බලපෑම් ඇතිකරනු ලබයි.

# ■ සමාප්ති සටහන

දුෂ්කර කාලවලදී පවා යුක්තිය සහ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටින මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ධෛර්යය සහ කැපවීම සඳහා මෙය උපහාරයකි. එය ඔවුන්ගේ හඬ නැංවීමට, අභියෝග ජය ගැනීමට සහ සැබෑ වෙනසක් ඇති කිරීමට උපකාර කිරීමට ප්‍රායෝගික මෙවලම් සහ උපාය මාර්ග සපයයි. මෙම මාර්ගෝපදේශය මානව හිමිකම් ආරක්ෂකයින්ට ඔවුන්ගේ උත්සාහයන් වඩා හොඳ, සාධාරණ ලෝකයක් ගොඩනැඟීමට හේතු වන බව දැනගෙන ඉදිරියට යාමට පොළඹවයි. සියල්ලන් වෙනුවෙන් තිරසාර වෙනසක් නිර්මාණය කරමින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ අගය කිරීම සහතික කිරීම සඳහා අප එක්ව කටයුතු කළ යුතුය.

# මානව හිමිකම් වෙනුවෙන් උද්දේශනය

උද්දේශන කාර්යභාරය විසින් ආයතන වගවීම පමණක් නොව අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ද මෙහොයවයි.

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

Right To Life Human Rights Center
No. 56/02 Palitha Pl, Colombo 09,Sri Lanka
Tel/Fax : +94 011 266 9100
E-Mail : right2lifelk@gmail.com
Web: www.right2lifelanka.org

ISBN 978-624-5860-10-4
9 786245 860104